14098

# SAMANTA KÚṬA WARṆANÁ.

BY

THE VENERABLE VÉDÉHA MAHÁ STHAVIRA,
*Principal of the Pratiraja Pariveṇa.*

---

# සමන්තකූටවණ්ණනාව.

ඇවාසී වලානේ ධම්මානන්ද ස්ථවිර ස්වාමීන්

සහ

ඤාණිස්සර සාමීන් විසින්

සන්න ලියනලදී.

---

COLOMBO:
H. C. COTTLE, ACTING GOVERNMENT PRINTER, CEYLON.

1890.

C 45

# SAMANTA KÚṬA WARṆANÁ,

BY THE

VENERABLE VÉDÉHA MAHÁ STHAVIRA,

*Principal of the Prativája Parivéṇa.*

---

TRANSLATED INTO SINHALESE AND EDITED BY

THE REV. W. DHAMMÁNANDA STHAVIRA,

*Principal of the P. Dhammachétiya Parivéṇa at Ratmaláṇa,*

AND

THE REV. M. ÑÁṆISSARA,

AT THE SUGGESTION OF THEIR TEACHER,

THE VEN. H. SUMANGALA,

*Chief Náyaka Théra of the Western Province and of the Shripáda ; Principal of the Vidyódaya Parivéṇa at Máligákanda.*

---

COLOMBO :

H. C. COTTLE, ACTING GOVERNMENT PRINTER, CEYLON.

1890.

# සමන්තකූටවර්ණනාව.

පුස්රිජ පරිවෙණාධිපති

**පූජ්‍යාචාර්ය්‍ය වෛදෙහ මහාස්වාමිපාදයන්වහන්සේ විසින්**

විරචිතයි.

---

කොළඹ මාලිගාකන්දේ විද්‍යොදයපරිවෙණාධිපති

**පූජ්‍යාචාර්ය්‍ය හික්කඩුවේ ශ්‍රීසුමඞ්ගලාභිධාන**

දකුණු බටහිරි පලාත් සහිත
ශ්‍රීපාදස්ථානයෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්වාමිපාදයන්වහන්සේගේ ශිෂ්‍යවූ

රත්මලානේ පරමධම්මචෛත්‍යපරිවෙණනිවාසී

ආචාර්ය්‍ය වලානේ ධම්මානන්ද ස්ථවිරස්වාමීන් සහ

ඤාණිස්සර සාමීන් විසින්

**ශුද්ධකොට ලියනලද පදාර්ථවර්ණනා සමෙතයි.**

ආර්තර් හැමිල්ටන් ගෝර්ඩන් ලඞ්කාණ්ඩුකාරතුමාණන් විසින්

පිළිගන්නාලදී.

---

කොළඹ :

එච්. සී. කොට්ල්, ලඞ්කාවේ රාජකීය මුද්‍රාශාලාවෙහි

වැඩබලන ප්‍රධානයා විසින් මුද්‍රණය කරනලදී.

---

2433.

## විඥාපනය.

සමන්තකූටවණ්ණනා නම්වූ මෙම මාගධීපද්‍යප්‍රබන්ධයෙහි අප මහබෝසතානන් තුසිත දිව්‍යලෝකයෙහි "සන්තුසිත" දිව්‍යපුත්‍රව උපන් තැන් පටන් අතැවැස්සන් සමඟවූ උරුවෙල්කසුප් මහතවුසානන්ගේ අර්හත්ඵලප්‍රාප්තිය දක්වා ඇති ශ්‍රීශෞද්ධෝදනී සම්බුද්ධචරිතය සම්පූර්ණයෙන් ප්‍රකාශවී තිබේ.

එම ශාක්‍යමුනීන්ද්‍රචරිතය ප්‍රකාශවූ බෝධිවංශ, දාඨාවංශ, ජිනචරිතාදි වෙනත් නොයෙක් ග්‍රන්ථ ඇති නමුත් ඒ එකම ප්‍රකරණයකින්වත් ප්‍රකාශනොවන සෞගත චරිත රාශියක් විශෙෂවශයෙන් මෙහි ප්‍රකාශවෙයි.—එනම් අප බුදුන් ලක්දිව් වැඩි ගමන් ආදියයි. මේ ප්‍රකරණ කර්තෘ ආචාර්‍ය්‍යයන්වහන්සේගේ මුඛ්‍යාපෙක්‍ෂාවත් එම වියයුතුයි· ඒ අප ගොයුම් මාහිමියානන් ලක්දිව් වැඩි ප්‍රස්තාවන්හිදී ලක්දිව යක්‍ෂභය සංසිඳවීම්, නයිදඹර සංසිඳවීම්, කැලණි වැඩි ගමන්, සමන්දෙව්රදුන් අයැදුමින් සමන්කුළුපව්වෙහි සිරිපාලකුණු පිහිටවීම ආදිය මෙහි විසදකොට දක්වා තිබෙන හෙයින් විශිෂ්ට සම්බුද්ධචරිත රාශියක් මෙහි ප්‍රකාශ වන බව වැඩිදුරටත් සැලකියයුතුයි. එසේ ඒ විශෙෂවර්‍ණ්‍යප්‍රකාශයෙහිදී ලඞ්කාවේ ඒ ඒ පලාත් විශෙෂ හා ඒ ඒ පලාත්වල පර්වතාදීන්ගේ විශෙෂවිභාගද, කැලණි, මහවැලි ආදී ගඞ්ගා සම්භවාකෘතිද මනාසේ විභාවනයකොට තිබේ.

ග්‍රන්ථකරණයෙහි ප්‍රාප්තස්ථානයන්හි ප්‍රමාණ සලකා කවිජනයන්ගේ සිත් දිනාගන්නාලෙස පුරවණ්ණනා වන වණ්ණනාදියෙන් සාලඞ්කෘතකොට තිබෙනහෙයින් ජ්‍යෙලඞ්කාරාදියෙන්ද සමුල්ලසිත බව පෙණෙයි.

එහෙයින්ම ලඞ්කාවේ මාගධී කාව්‍යකර්තෲවරයන් විසින් මෙම පද්‍යබන්ධනය සමාදරයෙන් පරිශීලනය කරගෙණ එනලද සිරිත මේ දක්වා පවතිනවා මෙන් දාඨාවංශ, අත්තනගලුවංශ, ජිනචරිතාදි උසස් පඞ්ක්තියේ මාගධී කාව්‍ය විශ-

මෙසේ මෙම සම්බන්ධකූටවණ්ණනා නම් පාලිගන්ථයෙන් ... පණ්ඩිතයන් විසින් මිනුම්න් පෙරටුව පිළිගන්නාලදී.

මෙම ගාථාමය ප්‍රකරණයෙහි ගෞරවය මහත් බව සාහිත්‍යාචාර්යමෙහි සත්පුරුෂ විබුධජනයන් විශේෂයෙන් ... මෙහි කාලය කලිකාලසාහිත්‍ය සර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු මහරජතුමන්ගේ කාලය හෙයින් පූර්වපණ්ඩිතයන්ගෙන් ලබනාව එකොළොස කාලයයි.

මීට අභිනවණ්ණනාවක් කොට අපේ ධම්මාචාර්යෝත්තමවූ දක්ෂිණදිශාවෙහි මාහිමියානන්ට අචාර්‍ය්‍යප්‍රාප්තයක් වශයෙන් සුදුහුම්පොල රත්මලානේ පරමධම්මචේතියාරාමවාසාරාධිපති අපගේ අචාර්යවූ දෙපිහිටිවලේ **සඞ්ඝරක්ඛිතාභිධාන** ස්ථවිර ස්වාමිපාදයන් විසින් කරණලද අරමුණාව පිළිගෙණ අපේ **සුණිසාරාභිධාන** නියුතාම් සමඟ මෙම අභිනවණ්ණනාව ලියා දුන් බුදු පඤ්ඤාසාර විද්‍යෝදයපරිවේණාධිපති අපේ අචාර්යෝත්තම **ශ්‍රීසුමඞ්ගලාභිධාන** නායකස්ථවිරස්වාමීන් වහන්සේගේ විශිෂ්ටෝපදේශයෙන් අලඞ්කරණලදී.

අපේ මේ අභිනවණ්ණනාවට පෙර තුබුණාවූ අසපුරුෂ ප්‍රාසේ පොතපත්තාලද, මෙහි ගැටපද පත්පුරු කුණ ඉවතලවූ බව සතුටින් මතක්කරමු.

පඤ්ඤාසාර අප අචාර්‍යෝත්තම විද්‍යෝදයපරිවේණාධිපතීන් වහන්සේ විසින් මේ පොත සම්බන්ධ කාර්‍ය ලංකාණ්ඩු කාර උතුමාණන්වහන්සේට මතක්කරණලද්දීන්, එම අති ගෞරවනීය ආර්තර් හැමිල්ටන් ගෝර්ඩන් ලංකාණ්ඩු කාරතුමාණන්වහන්සේගේ ආඥාවපිට රජයේ මුද්‍රණාලයෙහි මුද්‍රණය කරවනලදී.

මුද්‍රණයෙහිදී එහි ප්‍රධානනායකත් ජයිම් මහතා සහ උපප්‍රධානවූ කොටල් මහතාත් ඉතා මිත්‍රකමින් සහ සැලකිල්ලෙලුත් මෙහි කටයුතු ඉටුකළ බවද මතක්කරමු.

මෙයට, **මලාණේ ධම්මානන්ද ස්ථවිරයෝය.**

ශ්‍රී බු. ව. 2433 වෙසක් පුර 15වක් ලත් ඊම දින
රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙණේදීය.

පෙර මෙම සමන්තකූටවණ්ණනා නම් පාලිකාව්‍යයක් ද පණ්ඩිතයන් විසින් මුද්‍රිත පෙරවූව ළිහිණ්ණාලි.

මෙම කාව්‍යය ප්‍රකරණයෙහි ගෞරවය මහත් කාව්‍යසිරිමෙහි සත්පරවූ විවෙච්නයන් විශයෙහි සඳහන් මෙහි කාලය කලිකාලසාහිත්‍යසර්වඥපණ්ඩිත පරාක්‍රම මහරජතුමන්ගේ කාලය කෙයින් පූර්වපණ්ඩිතයන්ගෙන් ලබනව එකොනක කාලයයි.

මීට අත්‍ථවණ්ණනාවක් කොට අපේ ධම්මාචාර්‍යයන්වහන්සේ දශපිරිවෙන් මාහිමියන්ට අවවාදප්‍රාසාදයක් විශයෙන් පුදගලෙස රත්මලානේ පරමධම්මචේතියාරාමවාසාරජ්ජ අපගේ අවසාන දෙකිපිපිලේ **ශ්‍රීසරණකීර්තිනාභිධාන** ස්ථවිර පාදයන් විසින් කරණලද අරධකාව ළිලිමෙහි අපේ **ඥාණිසරාභිධාන** හිමුතම සමග මෙම අත්‍ථවණ්ණනාව ලියා ඉන් පුද, යථොක්ත විද්‍යෝදයපරිවෙණිවැසි අපේ ආචාර්‍යයතුමා **ශ්‍රීසුමඞ්ගලාභිධාන** නායකස්ථවිරපාදයන් වහන්සේගේ විශ්‍රෝපදේශයෙන් ශුද්ධකරණලදි.

අපේ මේ අත්‍ථවණ්ණනාවට පෙර තුමුනැම් අසලුලාම් ප්‍රකාශ කොටගත්තාලද මෙහි ගැටපද පත්‍රුරු කුණ ඉවතලම් මම සතුටින් මතක්කරමු.

යථොක්ත අප ආචාර්‍යයතුමා විද්‍යෝදයපරිවෙණධිපතිහිමි වහන්සේ විසින් මේ පොත සම්බන්ධ කාරණ ලබාගත් සාර ලංකාණ්ඩුවහන්සේට මතක්කරණලදින්, එම අති ගෞරවනීය ආර්තර් හැමිල්ටන් ගෝර්ඩන් ලමහත්ම රජතුමයන්ගේ අනුවසිට රජයේය මුද්‍රණශාලාලයෙහි මුද්‍රණය කරවනලදී.

මුද්‍රණයෙහිදී එහි ප්‍රධානතැන්පත් ජ්යිෆ් මහතා සහ ලපදුවානමු කොටල් මහතාත් ඉතා මිත්‍රතාමින් සහ සැලකිල්ලෙන් මෙහි සට්පුතු ඉවසීකල බවද මතක්කරමු.

මෙබඳට, වලානේ ධම්මානන්ද ස්ථවිරයෝය.

ශ්‍රී බු. ව. 2433 වෙසක් පුර 15වක් ලත් දිනය දින
රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙණේදිය.

# ERRATA.

## ශුද්ධපත්‍රය.

### ගාථාවන්හි.

| පිං. | ගාථා. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 21 | 75 | දුගගතිං | දුග්ගතිං |
| 48 | 180 | හෙඩුව | හෙණ්ඩුව |
| 76 | 296 | හාරසාරපිං | හරසාරපිං |
| 96 | 381 | පතතිපනතා | පතතිපයාති |
| 149 | 539 | සනාජිගෙහා | සංහාජිගෙහ |
| 192 | 684 | සුධාසිනං | සුධාසිතං |

---

### සන්නයෙහි.

| පිට. | සන්න. | වරද. | නිවරද. |
|---|---|---|---|
| 27 | 100 | (ඒ හන්සළුව) | නං, ඒ හන්සළුව ; |
| 29 | 107 | පුරස්ත්‍රීන්ගේ: | පුරස්ත්‍රීන්ගේ; සොම, සෞ- මෑවූ ; |
| 36 | 132 | බෝසත්තෙම : | බෝසත්තෙම; අඩිවෘසෙබා, ඉවසා ; |
| 39 | 147 | සේන්: | සේන්; දල්හාමෘහසො, දූඩි සිත් ඇතිසේන් ; |
| 43 | 161 | ලයගාමයි | ලතාගහාමයි |
| 65 | 251 | සම්පයෙහි; | සම්පයෙහි; නිහසා, අහසින්; |
| 66 | 258 | දුම්මනො, අසනාතු සිටසිත් ඇතිවූයේ: | දුම්මනො තුඩා, අසන්තුෂ්ට සිත්ඇතිව ; |
| 79 | 310 | මාපෙතිවාත | මාපයිතිවාත; |

# ERRATA.

## ශුද්ධපත්‍රය.

### ගාථාවන්හි.

| පිටු. | ගාථා. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 21 | 75 | දුගගනධං | දුග්ගන්ධං |
| 48 | 180 | හෙඬුව | හෙණ්ඬුව |
| 76 | 296 | නාරසාරපිං | නරසාරපිං |
| 96 | 381 | පක්ඛිපන්තා | පක්ඛිපන්ති |
| 149 | 539 | සන්ධිගෙහා | සංධිගෙහා |
| 192 | 684 | සුධාසිනං | සුධාසිතං |

---

### සන්නයෙහි.

| පිට. | සන්න. | වරද. | නිවරද. |
|---|---|---|---|
| 27 | 100 | (ඒ හන්සළුව) | නං, ඒ හන්සළුව ; |
| 29 | 107 | පුරස්ත්‍රීන්ගේ; | පුරස්ත්‍රීන්ගේ; සොම්, සෞම්‍ය මනාවූ ; |
| 36 | 132 | බෝසත්තෙම ; | බෝසත්තෙම; අධිවාසෙත්වා, ඉවසා ; |
| 39 | 147 | සේක්; | සේක්; දළ්හාමනසො, දැඩි සිත්ඇතිසේක් ; |
| 43 | 161 | ලගගාමසි | ලනගගාමසි |
| 65 | 251 | සම්පයෙහි; | සම්පයෙහි; නාගසො, අගසින්; |
| 66 | 258 | දුම්මනො, අසන්තුෂ්ටසිත් ඇතිවූයේ; | දුම්මනො හුත්වා, අසන්තුෂ්ට සිත්ඇතිව ; |
| 79 | 310 | මාපෙත්වාන | මාපයිත්වාන; |

| පිට. | පන්ති. | වරද. | නිවරද. |
|---|---|---|---|
| 82 | 324 | දීගරනහාරං, | දීගයානාරං, |
| 83 | 329 | මුහුණු ඇති; | මුහුණු ඇති; ලකුළුවලට ලාටකො, හැකුළුන රැළි සහිත නලලක් ඇති; |
| 94 | 373 | සඬමනොම; | සඬමනොම; තදු, එකල්හි; |
| 98 | 388 | විඩිවූ; | විඩිවූ; මහානතං, මහත්වූ; |
| 109 | 423 | තං | එතං |
| 115 | 441 | ඕරයන්වහන්ස; | ඕරමූ; සාමි, සවාමින්වහන්ස; |
| 128 | 477 | සුගන්ධරෙ | සුගන්ධරමහි |
| 141 | 515 | උරුනාගවනාභිධානං, | තං උරුනාගවනාභිධානං, ඒ |
| 157 | 559 | අත්; | ගුජයන්; |
| 157 | 559 | කක්ශමුවාහු; | කක්ශමුවාහු; ගජ්ජනං ගජ්ජනතා, ශිගුම් ගුගුරුමින් නාහු; |
| 164 | 578 | සිතා | ශිතාන |
| 174 | 607 | නිගගත | පරිනිහගත |
| 182 | 637 | දන්වුන්; | දන්නවුන්; |
| 190 | 675 | තසු, ඒ පාවිල්හි; | තසු උපරි, ඒමත්තොහි; |

| පිට. | ගාථා. | වරද. | නිවරද. |
|---|---|---|---|
| 82 | 324 | දීඝරත්තාරං, | දීඝයාතාරං, |
| 88 | 329 | මුහුණු ඇති ; | මුහුණු ඇති; ආකුඤ්චිතලලාටකො, හැකුළුන රැළි සහිත නළලක් ඇති ; |
| 94 | 378 | සව්වනෙම; | සව්වනෙම; තද, එකල්හි ; |
| 98 | 388 | විඩිමු ; | විඩිමු; මහයානං, මහත්මූ ; |
| 109 | 423 | තං | එතං |
| 115 | 441 | ධීරයන්වහන්ස ; | ධීරමූ; සාමි, ස්වාමින්වහන්ස ; |
| 128 | 477 | සුගන්ධරෙ | සුගන්ධරම්හි |
| 141 | 515 | උරුනාගවනාභිධානං, | නං උරුනාගවනාභිධානං, ඒ |
| 157 | 559 | අත් ; | ගුජයන් ; |
| 157 | 559 | කකීශමූවාහු ; | කණීශවූවාහු ; ගජ්ජනං ගජ්ජනානා, ගිගුම් ගුගුරුවන් නාහු ; |
| 164 | 578 | සිතා | සිතන |
| 174 | 607 | නිගගත | පරිනිගගත |
| 182 | 637 | දන්මුන් ; | දන්නවුන් ; |
| 190 | 675 | තතු, ඒ පාවිල්හි ; | තතු උපරි, ඒමත්තෙහි ; |

පූජාගාථා.

නමාමි සාරසනමාමිතාසයං
සතං මිතාකාරමිතාභිපූජිතං,
පභඞ්කරං සඞ්කරසාධුදස්සිතං
ජිනං ජනානන්ද ජනානුකාරිතං.

නමාමි ධම්මං සනමාමිතායනං
සතං නිරොධස්ස නිරොධමග්ගදං,
ගතං මුනින්දස්ස මුනින්දපූජිතං
ජිතප්පදං ධම්මපදං පරායණං.

නමාමි සඞ්ඝං පනමාමි සඞ්ගුණං
ගුණප්පදං ධම්මපදානුබොධිනං,
ඛීණඞ්ගසුඛිං නරසුඛදනිරං
නිරඞ්ගණං තං ගණධීරපුඞ්ගවං.

(සතුධියමකා.)

---

චිරාදිසංයුතපදප්පබන්ධසිනා
පසත්ථසත්ථන්තරපාරදස්සිනා,
විදූන **වෙදෙහ** මහාසිවෙසිනා
කතා තතා යා **සුමනද්දිවණ්ණනා.**

තස්සාත්ථජාතමවගන්තුමනප්පපඤ්ඤා,
පඤ්ඤුතතගතිනිපුණ නිපුණත්ථදස්සී,
හොතීතිප්පගු න පගෙවො කිල යෝ'ප්පපඤ්ඤො,
තත්තං හිතත්ථවරමත්ථ සමිජ්ඣතූති.

චින්තාමණී නිප්පමාණිජිනියා
පාඨප්පසුද්ධිකරණානුපුබ්බකං,
විතණ්ඩිතුත්තං හතසබ්බකිබ්බිසා
වතපාරිභොගාම මයං මහන්තකා.

## සමන්තකූටවණ්ණනාව.

"සංඥං නිමිත්තං කත්තාරං පරිමාණං ප්‍රයොජනම්,
ප්‍රාගුක්ත්වා සමීහිතාශ්‍රාණං පශ්චාච්ඡාස්ත්‍රානුවණ්ණනං යෙත්"

යනු ප්‍රාචීනාචාර්‍ය්‍ය වචනහෙයින් ප්‍රථමකොට සංඥාදී පඤ්ච විභාවනය වණ්ණනාකාරයන්ගේ පුරෝගාමී ධර්‍මතාවයක්ව තිබේ. එහෙයින් එකී ආචාර්‍ය්‍ය වචනානුශාසනාව "සමන්තකූට වණ්ණනා" නම්වූ මෙම පද්‍යප්‍රකරණය සම්බන්ධ සංඥාදී පඤ්චකය යථාක්‍රමයෙන් දක්වනු ලැබේ.

**සංඥා**—"සමන්තකූට වණ්ණනා" යනු මෙහි සංඥා (නාම)යි.

නුමුදක් සමන්තකූට පර්වතය සම්බන්ධ වණ්ණනාවම නොව තදාශ්‍රිත අන්‍යකථා ප්‍රබන්ධ ඇතද මුඛ්‍යවශයෙන් සමන්තකූට පර්වත වණ්ණනාවිෂයකොට ග්‍රන්ථ කර්තෘ ආචාර්‍ය්‍යයන්වහන්සේ ප්‍රකරණ ක්‍රියායෙහි ප්‍රසඞ්ගහෙයින් අන්වර්ථ වශයෙන් මේ ප්‍රකරණය "සමන්තකූට වණ්ණනා" නම් වී.

**නිමිත්ත**—බාහ්‍යාභ්‍යන්තර වශයෙන් ද්විවිධයි—ඉන් බාහ්‍ය නිමිත්තනම්, අරණ්‍යවාසී රාහුල මහාස්ථවිරෝත්තමයන්වහන්සේගේ ආරාධනාවයි; අන්තර්නිමිත්ත හෙවත් අභ්‍යන්තර නිමිත්තනම්, මේ ප්‍රකරණය පරිශීලනයෙන් පශ්චිම ජනතාවට අභිවෘද්ධියක් උවමැනව යන කරුණාපරවශතාවයි.

**කර්තෘ**—කවිකුලතිලකායමාන වනරත්නානන්දාභිධාන මහාස්ථවිරෝත්තමයන්වහන්සේගේ ශිෂ්‍යවූ, කලිකාලසාහිත්‍ය සර්වඥපණ්ඩිතපරාක්‍රමබාහු මහරජාණන්ගේ ප්‍රතිරාජදේව නම් ඇමතියානන් විසින් කරවනලදහෙයින් ප්‍රතිරාජ නම් පිරිවෙන්හි අධිස්වාමීවූ බ්‍රාහ්මණවංශෝද්භූත පූජ්‍යාචාර්‍ය්‍ය වෙදෙහ මහාස්වාමීපාදයෝයි.*

---

* මහානාම රජු දවස අට්ඨකථාචාර්‍ය්‍ය බුද්ධඝොෂ මහාස්ථවිර ස්වාමීන් පටන් කලිකාලසාහිත්‍යසර්වඥපණ්ඩිතපරාක්‍රමබාහු මහරජාණන් කාලය දක්වා ඇතිවූ ග්‍රන්ථකරණාදියෙන් බොහෝ ශාසනසඞ්ග්‍රහ කළ උතුමන් "ශාසනාවතාර" නම් ප්‍රකරණයෙහි "ශටකී මහානාමරජු දවස බුද්ධඝොෂ නම් අටුවාචාරී මහාස්ථවිරපාදයන් පටන් මේ අතුරෙහි බුද්ධදත්තය, ධම්ම

**පරිමාණ**—පඨම මාරවිජයකථා, දුතිය මාරවිජයකථා, තතිය මාරවිජයකථා, චතුත්ථ මාරවිජයකථා, පඤ්චම මාරවිජයකථා, ඡට්ඨ මාරවිජයකථා, සත්තම මාරවිජයකථා, අට්ඨම මාරවිජයකථා, නවම මාරවිජයකථා, දසම මාරවිජයකථා, ඒකාදසම මාරවිජයකථා, (තත්සාමාන්‍ය) අභිසම්බොධිකථා, පඨමසත්තාහ, දුතිය සත්තාහ, තතිය සත්තාහ, චතුත්ථ සත්තාහ, පඤ්චම සත්තාහ, ඡට්ඨ සත්තාහ, සත්තම සත්තාහ, ලඞ්කාය පඨමාගමනකථා, දුතියාගමන කථා, කල්‍යාණිදෙසාගමන කථා, සමන්තකූට වණ්ණනාකථායයි භාගවශයෙන් දෙවිස්සකි; ගාථාවශයෙන් ෂණ්ණවත්‍යධික සප්තශත* ගාථාගණනෙකින් වෙති.

**ප්‍රයොජන**—මෙම කථාප්‍රබන්ධය දැනගැණීමෙන් ලොක යාගේ ශාස්ත්‍රාගම ප්‍රබොධය හා එහෙයින්ම රත්නත්‍රය කෙරෙහි භක්තිශ්‍රද්ධාතිශය ඇතිවීමෙන් සම්දුඃඛක්‍ෂයවූ ශාන්තසුඛ ප්‍රාප්ති යෙහි කෞශල්‍යයයි.

මේ මෙහි සංක්‍ෂිප්තවිෂයාවබොධයයි.

---

පාලිය, ජේතපාලිය, යසොමිය, ධම්මශ්‍රිය, නන්දිය, ආනන්දිය, අනුරුද්ධය, උප තිස්සය, බුද්ධරක්ඛිතය, මොග්ගල්ලායනය යනාදී ආචාර්ය මහාස්ථවිරයන් හා එකලෑතීන් මෙතනසන්ප්‍රාප්තධාරණියට සමර්ත්‍යවූ වජ්‍රඥානඇති ශාරිපුත්‍ර මහාපාලිපාදයන් පවත් සවිතර්අකුනය, ප්‍රමඩ්ගලය, වාගීශ්වරය, ධම් කීර්තිය, නාගසේනය, ආනන්දය, මෙධංකරය, බුද්ධප්පියය, අනවමදර්ශිය, යනාදී මහාස්ථවිරයන් නොයෙක් ටීකාටීකා හා තන්ත්‍රවංශපායවූ අනෙකප්‍රකාර ධම්ප්‍රබන්ධ හා සන්න ගැටපද පිටපත් ආදිය උපදවා බුද්ධියගේ පශ්‍රීපති ශාසනය බැබලුවූහ" යනාදීන් දක්වා තිබෙන ආකාර සලකාගැනීමම ග්‍රන්ථ ගෞරවය හා ග්‍රන්ථකර්තෘ ආචාර්යන්ගේ ගෞර වශයෙණිසත් ප්‍රමාණමෙවයි.

* ග්‍රන්ථකර්තෘ සඳගිනාදි ජෝනනන ...

# සමන්තකූට වර්ණනාව.

## SAMANTA KÚṬA WARṆANÁ.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

1. **සතතවිතතකිත්තිං ධස්තකන්දප්පදප්පං**
**තිභවහිතවිධානං සබ්බලොකෙකකෙතුං,**
**අමිතමතිමනග්ඝං සන්තිදං මෙරුසාරං**
**සුගතමහමුදාරං රූපසාරං නමාමි.**

---

"අහං සුගතං නමාමි" යනු මෙහි ක්‍රියාකාරකපදසම්බන්ධයි.
අහං, මම ; සුගතං, සර්වඥයන්වහන්සේ ; නමාමි, වඳිමි.

(කෙබඳුවූ සර්වඥකෙනෙකුන්ද යත්?)

1. සතත, අනවරතයෙන් ; විතත, පතළාවූ ; කිත්තිං, ("**ඉතිපි සො භගවා අරහං**" යනාදීන් උක්ත) කීර්තිඇති ; ධස්ත, නසනලද ; කන්දප්පදප්පං, අනඞ්ගාභිමාන ඇති ; තිභව, භවත්‍රයට ; හිතවිධානං, අභිවෘද්ධි කරන්නාවූ ; සබ්බලොක, මුළුලොවට ; එකකෙතුං, අද්විතීයධ්වජයක් වැනිවූ ; අමිතමතිං, අප්‍රමාණප්‍රඥාතිශය ඇති ; අනග්ඝං, අනර්ඝවූ ; සන්තිදං, ශාන්ති සඞ්ඛ්‍යාතනිර්වාණය දෙන්නාවූ ; මෙරුසාරං, (චතුර්විධ වෛශාරද්‍යඥානාදී ගුණයෙන්) මහාමෙරුපර්වතය මෙන් ස්ථිරසාරවූ ; රූපසාරං, (ද්වාත්‍රිංශත්වර මහාපුරුෂලක්ෂණසමෙත) රූපයෙන් සාර (උතුම්)වූ ; උදාරං, (ගුණයෙන්) මහත්වූ ; සුගතං, සර්වඥයන්වහන්සේ ; අහං, මම ; නමාමි, (සකසා) වඳිමි.

2. හතදුරිතතුසාරං මොහපඞ්කාපතාපං
මනකමලවිකාසං ජන්තුනං සෙසකානං,
කුමතිකුමුදනාසං බුද්ධපුබ්බාචලග්ගා
උදිතමහමුදාරං ධම්මභානුං නමාමි.

3. සකලවිමලසීලං ධූතපාපාරිජාලං
සුරනරමහනීයං පාහුණෙය්‍යාහුණෙය්‍යං,
උජුපටිපන්නං පුඤ්ඤක්ඛෙත්තං ජනානං
ගණමහමභිවන්දෙ සාරදං සාදරෙන.

---

2. හතදුරිතතුසාරං—හත, නසනලද ; දුරිතතුසාරං, පාප නැමති තුහින ඇති ; මොහපඞ්කුපතාපං, අවිද්‍යා නැමති කර්දම ශුෂ්ක කරන්නාවූ ; සෙසකානං, යහපත් නිර්වාණමාර්ගී ගවෙෂීවූ ; (නොහොත්) අසෙසකානං, නිරවශෙෂවූ ; ජන්තුනං, සත්වයන්ගේ ; මනකමලවිකාසං, චිත්තසන්තාන නැමති පද්ම ප්‍රබොධකාරීවූ ; කුමති, දුර්බුද්ධි නැමති ; කුමුද නාසං, කෛරව නෂ්ටකාරීවූ ; බුද්ධ, සර්වඥනැමති ; පුබ්බාචලග්ගා, උදයපර්වතාග්‍රයෙන් ; උදිතං, පහළවූ ; උදාරං, (ගුණයෙන්) මහත්වූ ; ධම්මභානුං, සද්ධර්ම නැමති සූර්‍ය්‍යයා ; අහං, මම ; නමාමි, (සතතා) වඳිමි.

3. සකලවිමලසීලං, අශෙෂ නිර්මලශීල (සතර) ඇති ; ධූතපාපාරිජාලං—ධූත, කම්පාකොට හරණලද ; පාපඅරිජාලං, පාප නැමති ශත්‍රුසමූහ ඇති ; සුරනර, දිව්‍යමනුෂ්‍යයන් විසින් ; මහනීයං, පිදියයුතුවූ ; පාහුණෙය්‍යං, අමුතු පඬුරු පිදීමට සුදුසුවූ ; ආහුණෙය්‍යං, සියලු සත්කාරයට සුදුසුවූ ; උජුපටිපන්නං, (ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගසඞ්ඛ්‍යාත) සෘජුවූ මාර්ගයට පිළිපන්නාවූ ; ජනානං, සත්වයන්ට ; පුඤ්ඤක්ඛෙත්තං, පුණ්‍යක්ෂෙත්‍රවූ ; සාරදං, උත්තමඵල දායකවූ ; ගණං, ආර්‍ය්‍යසඞ්ඝයාවහන්සේ ; අහං, මම ; සාදරෙන, ආදරාන්විත සිතින් යුක්තව හෙවත් භක්ත්‍යාදරයෙන් ; අභිවන්දෙ, (සතතා) වඳිමි.

4. ඉති කලිතපණාමො හතසබ්බූපසග්ගො
සුගතවිමලපාදම්භොජසම්පාතපූතං,
සුමනසිඛරිරජ්ජං වණ්ණයිස්සං සුරානං
වසතිමතුලමෙතං සාධුජනා සුණන්තු.

5. සවණං ලපනාචෙව සතියාචාපි වන්දනා,
යස්ස සම්මා සුඛී හොති නිබ්බාණඤ්චාධිගච්ඡති.

6. තස්මා සප්පුරිසෙහෙදං පත්ථෙන්තෙහි තිසම්පදං,
සවණීයංහි සාධූහි අවික්ඛිත්තෙන චෙතසා.

---

4. ඉති, මෙසේ ; කලිත, කරණලද ; පණාමො, ප්‍රණාමහෙතු වෙන් ; සබ්බූපසග්ගො, සියලු උපද්‍රවයන් ; හතාවා, නසා ; සුගත, සර්වඥයන්වහන්සේගේ ; විමලපාදම්භොජ, නිර්මල ශ්‍රී පාදපද්මය ; සම්පාත, තැබීමෙන් ; පූතං, පවිත්‍රවූ ; සුරානං, දෙවියන්ගේ ; වසතිං, වාසස්ථානවූ ; සුමනසිඛරිරජ්ජං, සමන්තකූටපර්වතරාජයා ; වණ්ණයිස්සං, (පද්‍යබන්ධනමුඛයෙන්) වර්ණනාකරන්නෙමි ; ජනා, සත්වයෝ ; සාධු, මනාකොට ; (නොහොත්) සාධුජනා, සජ්ජනයෝතුමූ ; අතුලං, අසදෘශවූ ; එතං, මේ (වක්‍ෂ්‍යමාණ වර්ණනාව ; සුණන්තු, (ශ්‍රොත්‍රාවධාන කොට) අසත්වා.

5. යස්ස, යම් (සර්වඥ) කෙණෙකුගේ ; සවණං, (ගුණ) ශ්‍රවණයෙන්ද ; ලපනාචෙව, (ගුණ) කීමෙන්ද ; සතියාච, (ගුණ) සිහිකිරීමෙන්ද ; අපි, නැවත ; වන්දනා, (යම් සර්වඥකෙණෙකුට) වැඳීමෙන්ද ; සම්මා, මනාකොට ; සුඛී හොති, (යම්හෙයකින් සත්ත්වතෙම) සුව ඇත්තේවේද ; නිබ්බාණඤ්ච අධිගච්ඡති නිර්වාණයටත් පැමිණේද.

6. තස්මා, එහෙයින් ; තිසම්පදං, (මානුෂික දිව්‍ය නිර්වාණ යන) ත්‍රිවර්ගසම්පත්තිය ; පත්ථෙන්තෙහි, ප්‍රාර්ථනා කරන්නාවූ ; සප්පුරිසෙහි, සත්පුරුෂයන් විසින් ; ඉදං, මේ ප්‍රකරණය ; සාධූහි, සොභන ධර්මයන් කරණකොටගෙණ ; අවික්ඛිත්තෙන චෙතසා, වික්ෂිප්තනොවූ සිතින් යුක්තව ; සවණීයංහි, ශ්‍රවණය කටයුක්තේමය.

උපන්‍යාසයි.

7\. යො ලොකතිලකො නාථො පූරෙත්වා දසපාරමී,
ජාතො'සි තුසිතෙ කායෙ සන්තුසිතො'ති විස්සුතො.

8\. ආරාධිතො සුරාදීහි කාලො මාරිස තෙ අයං,
තිණ්ණො තාරයිමං ලොකං බහූ අප්පරජක්ඛකා.

9\. එතදත්ථාය තෙ වීර පූරිතා දසපාරමී,
බාහුං පිතුස්ස පුත්තො'ව ලොකො අලම්බතෙ තුවං.

10\. තෙසං තං වචනං සුත්වා මහාසත්තො මහාමුනි,
විලොකනෙ විලොකෙත්වා පඤ්චාමලවිලොචනො.

---

7\. ලොකතිලකො, තුන්ලොවට තිලකායමානවූ ; යො නාථො, යම් (ලොක) ස්වාමිකෙනෙක් ; දසපාරමී, දශපාරමී ධර්මයන් ; පූරෙත්වා, පුරා ; තුසිතෙ කායෙ, තුසිතදෙවනිකායෙහි ; සන්තුසිතොති, සන්තුසිත දිව්‍ය (පුත්‍රයා)යයි ; විස්සුතො, ප්‍රසිද්ධවූයේ ; ජාතො අසි, උත්පන්න වූයේද.

8, 9. මාරිස, නිදුකානන්වහන්ස ; තෙ, තුඹවහන්සේට ; අයං කාලො, (බුදුවීමට) මේ කල් වන්නේය ; තිණ්ණො, (සසර සයුරෙන්) එතරවූයෙක්ව ; ඉමං ලොකං, මේ ලෝවැසි ජනයා ; තාරය, (සසරින්) එතර කරව ; අප්පරජක්ඛකා, ප්‍රඥාචක්ෂුසෙහි අල්පවූ රාගාදි රජස් ඇත්තෝ ; බහූ, බොහෝ වෙති.
වීර, වීරයානන්වහන්ස ; තෙ, තුඹවහන්සේ විසින් ; එතදත්ථාය, මේ අර්ථය පිණිස ; දසපාරමී, දශපාරමී ධර්මයෝ ; පූරිතා, පූරණලද්දාහ, පිතුස්ස බාහුං, පියා අත (එල්ලෙන්නාවූ) ; පුත්තො ඉව, පුතකු මෙන් ; ලොකො, ලෝවැසිතෙමේ ; තුවං, තුඹවහන්සේ ; අලම්බතෙ, එල්බෙයයි ; සුරාදීහි, දිව්‍ය බ්‍රහ්මාදීන් විසින් ; ආරාධිතො, ආරාධනා කරණලද්දේද.

10\. මහාමුනි, මහත් බුද්ධිමත්වූ ; අමලවිලොචනො, නිර්මල ප්‍රඥාචක්ෂුසැති ; මහාසත්තො, ඒ මහාබොධිසත්වතෙම ; තෙසං, ඔවුන්ගේ ; තං වචනං, ඒ (ආරාධනා) වචනය ; සුත්වා, අසා ; පඤ්චවිලොකනෙ, පස්බැලුම් ; විලොකෙත්වා, බලා.

11. **ජම්බුදීපග්ගකම්බලෙ කණ්ණිකා'ව මනොරමා,**
**පුරී කපිලවත්ථූ'ති විසාණී'ව සුධාසිනං.**

12. **සිඛිනික්ඛමයාභාස තුඞ්ගසිඞ්ගසමඞ්ගිනා,**
**මණිසීහපඤ්ජරාකිණ්ණා (1) පාසාදා යත්ථ භාසරෙ.**

13 **සඝනෙ ගගනෙ නිච්චං සතෙරතසතානි'ව,**
**අනිලෙරිතපජ්ජොතසොණ්ණකෙතූ අහූ යහිං.**

14. **ජනානං නීලනෙත්තාභි වදනෙහි ච යාපුරී,**
**මධුපාලිසමොනද්ධ කඤ්ජිනිසිරිමාවහෙ.**

---

11. ජම්බුදීප, ජම්බුද්වීප නැමති; අග්ගකම්බලෙ, උතුම්වූ පළඹයෙහි; මනොරමා, සිත්කලුවූ; කණ්ණිකා ඉව, අග්‍රකර්ණිකාවක් වැනිවූද; සුධාසිනං, දෙවියන්ගේ; විසාණී ඉව, විෂාණ නම් රාජධානිය වැනිවූද; කපිලවත්ථු, කිඹුල්වත් නම්වූ; පුරී, නගරියක්; අසි, වී.

12. යත්ථ, යම් පුරයෙක්හි; සිඛිනික්ඛමය, සිහි සුවර්ණයෙන් කරණලද්දාවූ; ආභාස, ආලොක ඇත්තාවූ; තුඞ්ග, ප්‍රාංශුවූ; සිඞ්ග, (ප්‍රාසාද) ශෘඞ්ගයෙන්; සමඞ්ගිනා, සමුපෙතවූ; මණිසීහපඤ්ජර, මිණිසිම්හුදුරෙන්; ආකිණ්ණා, ගැවසිගත්තාවූ; පාසාදා, ප්‍රාසාදයෝ; භාසරෙ, බබලත්ද.

13. යහිං, යම් පුරයෙක්හි; සඝනෙ, මෙඝ සහිතවූ; ගගනෙ, අහස්තෙලෙහි; සතෙරතසතානි ඉව, සියගණින් විදුලි සෙයින්; අනිලෙරිත, වාතයෙන් කම්පිතවූ; පජ්ජොත, (එහෙයින්ම) බබලන්නාවූ; සොණ්ණකෙතු, සුවර්ණධ්වජයෝ; නිච්චං, සතතයෙන්; අහූ, වූද.

14. යා පුරී, යම් නගරියක්; ජනානං, ජනයන්ගේ; නීලනෙත්තාභි, නීලවර්ණනෙත්‍රයෙන්ද; වදනෙහිච, වක්ත්‍රයෙන්ද; මධුපාලි, භෘඞ්ගශ්‍රෙණීන් විසින්; සමොනද්ධ, ගැවසීගත්තාවූ; කඤ්ජිනීසිරිං, පද්මිනී විලාසයක්; ආවහෙ, උසුලන්නීද.

15. රථතුඞ්ගතුරඞ්ගෙහි ගජ්ජන්තෙහිච සා පුරී,
සඝොසුත්තුඞ්ගකල්ලොල ලොලසාගරසන්නිභා.

16. අව්හායන්තා'ව දෙවානං පුරලම්බා භුජාඉව,
මන්දානිලෙරිතා තුඞ්ගනානාරාගධජා යහිං.

17. නානාවෙසධරා යස්මිං නානාභූසනභූසිතා,
නානාසම්පත්තිසංයුත්තා නානාවිජ්ජාසු පාරගා.

18. නවයොබ්බනුද්දමා රූපෙන ච මනොහරා,
සබ්බවසූ නිරතා නිච්චං අනාකුලාකුලා සියුං.

---

15. සා පුරී, යම් පුරියක්; රථ, නානා ශෘංගාරය කළාවූ; තුඞ්ග, උස්වූ; තුරඞ්ගෙහිච, අශ්වයන් කාරණකොටගෙණද; ගජ්ජන්තෙහිච, (හස්ත්‍යාදීන්ගේ) ගර්ජනාවයෙන්ද; සඝොස, ඝොෂ සහිතවූ; උත්තුඞ්ග, උස්ව නැංගාවූ; කල්ලොල, රළපන්තීන්; ලොල, චලිතවූ; සාගරසන්නිභා, සමුද්‍රය සමාන විද.

16. යහිං, යම් පුරයෙක්හි; දෙවානං, දෙවියන්; අව්හායන්තාඉව, කැඳවන්නන් වැනි; පුරලම්බා, නගරශ්‍රීයගේ; භුජ ඉව, බාහුන් මෙන්; මන්දානිල, මන්දමාරුතයෙන්; ඊරිතා, කම්පිතවූ; තුඞ්ග, ප්‍රාංශුවූ; නානාරාගධජා, නානාවර්ණ ධවජයෝ, (බබලත්ද.)

17. යස්මිං, යම් පුරයෙක්හි; නානාවෙසධරා, අනේකවෙස ධාරීහුද; නානාභූසන භූසිතා, නානාභරණයෙන් සැරසුනාහුද; නානාසම්පත්ති, නොයෙක් සම්පත්තීන්; සංයුත්තා, යුක්තවූවාහුද; නානා විජ්ජාසු, නොයෙක් විද්‍යාවන්හි; පාරගා, පරතෙරට ගියාහුද.

18. නවයොබ්බන, අභිනව යෞවනයෙන්; උද්දමා, අතිශයින් උඩඟු වූවාහුද; රූපෙන, රූපලාවණ්‍යයෙන්; මනොහරා ච, මනොඥයෝද; නිච්චං, සතතයෙන්; සබ්බවසු, සබ අමනාප නොකරණලද; නිරතා, ඇළුනාහුද; අනාකුලාකුලා, (ජාතිවාදයෙන්) අමනාප නොකරණලද වංශවත්හුද; සියුං, වෙද්ද.

19. **නිච්චං කීළාවිදද්ධාහි නරනාරීහි සෙවිතා,**
**යා පුරී සාධු රූපා'සි මධුරාලාපිනීහිව.***

20. **තස්මිං සද්ධාදයොපෙත ඔක්කාකකුල කෙතුකො,**
**සුද්ධොදනව්හයො ආසි විස්සුතො භුවනත්තයෙ.**

21. **යස්සඞ්ඝිකමලෙ සබ්බභූභුජානං මහීතලෙ,**
**කිරීටමණිභාලී කීළන්තීව නිරන්තරං.**

22. **යස්ස පජ්ජට තෙජෙන පුරන්තොපි දිවාකරො,**
**වහතීවම්බරෙ ලීලං ඛජ්ජොපනිනො දිවා.**

---

19. යාපුරී, යම් පුරියක්තොමෝ; නිච්චං, නිරන්තරයෙන්; කීළාවිදද්ධාහි, ක්‍රීඩාවන්හි නිපුණවූ; නරනාරීහි, පුරුෂස්ත්‍රීන් විසින්ද; මධුරාලාපිනීහිව, මියුරුගී කියන්නියන්විසින්ද; සෙවිතා, සෙවනාලද්දී සාධුරූපා ආසි, මනොහර ස්වරූප ඇත්තියක් විද.

20. තස්මිං, ඒ පුරයෙහි; සද්ධාදයොපෙත, ශ්‍රද්ධාවෙන්හා දයාවෙන් යුක්තවූ; ඔක්කාකකුල, ඉෂ්වාකුවංශයට; කෙතුකො, ධ්වජයක්වූ; භුවනත්තයෙ, ලොකත්‍රයෙහි; විස්සුතො, ප්‍රසිද්ධවූ; සුද්ධොදනව්හයො, ශුද්ධොදන නම් පෘථිවීශ්වරොත්තමයෙක්; ආසි, වී.

21. මහීතලෙ, පෘථිවීතලයෙහි; සබ්බභූභුජානං, සියලු නරේන්ද්‍රයන්ගේ; කිරීටමණී, මකුටමාණික්‍ය නැමති; භාලී, භෘංගශ්‍රේණීහු; යස්ස, යම් රජෙකුගේ; අඞ්ඝිකමලෙ, පාපියුම්හි; නිරන්තරං, සතතයෙන්; කීළන්තී ඉව, ක්‍රීඩාකරන්නන් මෙන් වෙත්ද.

22. අම්බරෙ, ආකාශයෙහි; යස්ස, යමෙකුගේ; පජ්ජටතෙජෙන, පතලාවූ තෙජොමහිමයෙන්; පුරන්තො, නගරාභ්‍යන්තරයෙහිවූ; දිවාකරො අපි, හිරුතෙමේද; දිවා, දවල්හිවූ; ඛජ්ජොපනිනො, වඬුයාගේ; ලීලං, ලීලාව; වහති ඉව, උසුලන්නාක් මෙන් විද.

---

* “මධුරාලාපිනීවසා.”

23. යස්ස දානප්පවාහොයං නානායාචකජන්තුනං,
මනොදධිසු වෙලංනෙනාතික්කමෙනොව සන්තතං.

24. මතියා සුරමන්තීව ධනෙන ධනදෙවිය,
රූපෙන කුසුමෙසූ'ව සො ජුම්භති මහීතලෙ.

25. ගඞ්ගාභිසිත්තා රජ්ජෙන මහාමායා'ති විස්සුතා,
චණ්ඩිකා විය චන්දස්ස ගිරිජා'ව කපාලිනො.

26. ලක්ඛී'ව වාසුදෙවස්ස සීතා'ව රාමරාජිනො,
මහෙසී'සි වරාරොහා සුන්දරී සුන්දරාධරා.

---

23. ගස්ස, යමෙකුගේ ; දානප්පවාහොයං, දානනැමති ජල ප්‍රවාහයතෙම ; නානායාචකජන්තුනං, නොයෙක් යාචකජනයන්ගේ ; මනොදධිසු, චිත්තාර්ණවයන්හි ; වෙලංනෙන, වෙරළ කණ ; සන්තතං, නිරන්තරයෙන් ; අතික්කමෙනො ඉව, (පුරා) ඉක්මවන්නෙක් මෙන් විද.

24. සො, යමෙක්තෙම ; මතියා, ප්‍රඥාවෙන් ; සුරමන්ති ඉව, වෘහස්පති මෙන්ද ; ධනෙන, වස්තුවෙන් ධනදෙවිය, කුවෙරයා මෙන්ද ; රූපෙන, රූපශොභාවෙන් ; කුසුමෙසු ඉව, පුෂ්පවාණියා මෙන්ද ; මහීතලෙ, මිහිතෙලෙහි ; ජුම්භති ; බබලාද.

25, 26. චන්දස්ස, චණ්ඩයාගේ ; චණ්ඩිකාවිය, මරීචිය වැනිවූ ; කපාලිනො, ඊශ්වරයාගේ ; ගිරිජා ඉව, පාර්වතිය වැනිවූ ; වාසුදෙවස්ස, විෂ්ණුගේ ; ලක්ඛිඉව, ශ්‍රීකාන්තාව වැනිවූ ; රාමරාජිනො, (දශරථ පුත්‍රවූ) රාමරජුගේ ; සීතා ඉව, (ජනකරාජ දුහිතෘවූ) සීතාදෙවියවැනිවූ ; වරාරොහා, ප්‍රශස්ත කායප්‍රදෙශ ඇති ; සුන්දරාධරා, සොඳුරුවූ (බිබුපල වන්) තොල් ඇති ; රජ්ජෙන, රාජ්‍යයෙන් ; අභිසිත්තා, අභිෂෙක කරණලද්දාවූ ; මහාමායාති විස්සුතා, මහාමායායයි ප්‍රසිද්ධවූ ; සුන්දරී, සුන්දරාඞ්ගනාවෝ ; තස්ස, ඒ ශුද්ධොදන මහරජහට ; මහෙසී අසි, මෙහෙසියි වී.

27. **තස්සා කුච්ඡිකරණ්ඩම්හි අනග්ඝරතනං විය,**
**ද්වත්තිංසාහි නිමිත්තෙහි විම්හාපෙන්තො සදෙවකං.**

28. **සිතම්බුජකරෙ සෙතො සිතෙභච්ඡාපකො විය,**
**කත්වා පදක්ඛිණං මාතු පටිසන්ධිමගණ්හි සො.**

29. **දසෙකාදසමාසෙන තස්සෙවං ආසි චෙතනා,**
**පස්සිතුං සකඤාතීනං ගන්ත්වාන නගරං තදා.**

30. **නිවෙදෙත්වා නමත්ථං සා රඤ්ඤො තෙන සුසජ්ජිතෙ,**
**සපරිච්ඡදා තදා මග්ගෙ (2) ගච්ඡන්ති අන්තරාපථෙ.**

---

27. තස්සා, ඒ මායාදේවීන්ගේ ; කුච්ඡිකරණ්ඩම්හි, කුසැ නැමති පුබුගෙහි ; අනග්ඝරතනං විය, අනගි මිණිරුවනක් මෙන් ; ද්වත්තිංසාහි නිමිත්තෙහි, දෙතිස් පූර්වනිමිත්තෙන් ; සදෙවකං, දෙවියන් සහිත ලොකයා ; විම්හාපෙන්තො, විස්මය ප්‍රාප්ත කෙරෙමින්.

28. සිත අම්බුජකරෙ, හෙලපියුමක්ගත් සොඬ ඇති ; සිතෙ භච්ඡාපකො විය සෙතො, සුදුවූ හස්තිපොතකයෙකු මෙන් වෙමින් ; සො, ඒ මහාසත්ත්වතෙම ; මාතු, මව ; පදක්ඛිණං කත්වා, පැදකුණු කොට,* පටිසන්ධිං අගණ්හි, පිළිසිඳ ගත්තේසි.

29. තදා, එකල්හි ; දසෙකාදසමාසෙන ; දශමාසාධි මාසයකින් ; නගරං ගන්ත්වාන, (ස්වකීය) නුවරට ගොස් ; සකඤාතීනං, සියනෑයන් ; පස්සිතුං, දක්නට ; තස්සා, ඒ මහාමායාදෙවින්ට ; එවං, මෙසේ ; චෙතනා ආසි, සිතිවිල්ලක් විය.

30. තදා, එකල්හි, සා, ඒ මහාමායා දෙවිතොමෝ ; රඤ්ඤො, ශුද්ධොදනමහරජහට ; තමත්ථං, ඒ අභිලාසය (තොහොත්) ඒ සිතිවිල්ල ; නිවෙදෙත්වා, දන්වා ; තෙන, ඒ රජහුවිසින් ; සුසජ්ජිතෙ, මොනවට සදනලද ; මග්ගෙ, මාර්ගයෙහි ; සපරිච්ඡදා, පිරිවර සහිතවූවා ; ගච්ඡන්ති, යන්නී ; අන්තරාපථෙ, අතරමගදී:—

---

* ස්වපක්ෂයෙන් පෙණුනු පරිද්දී.

31. දෙවතානං මනොනන්දකරං නන්දනසන්නිභං,
දිස්වාන ලුම්බිනිං නාම උය්‍යානං මනනන්දනං.

32. තස්මිං කීළිතුමුස්සාහා පවිසිත්වාන තං වනං,
කීළන්ති උපගන්ත්වාන මඞ්ගලං සාලපාදපං.

33. විලොලපල්ලවාකිණ්ණං සුඵුල්ලකුසුමොනතං,
ගහෙත්වා සාලසාඛං සා සුරත්ත කරපල්ලවා.

34. දෙවෙහි ගහිතාරක්ඛා මහමානෙ සදෙවකෙ,
ජනෙසි තනයං මායා තනුජා ලොකලොචනං.

---

31. දෙවතානං, දෙවියන්ගේ ; මනොනන්දකරං, චිත්තානන්දකරවූ ; නන්දනසන්නිභං, නන්දනොද්‍යානය වැනිවූ ; මනනන්දනං, චිත්තානන්දකරවූ ; ලුම්බිනිං නාම, ලුම්බිනී නම්වූ ; උය්‍යානං, (සල්) උයන ; දිස්වාන, දැක.

32. තස්මිං, ඒ සල්වෙනෙහි ; කීළිතුං, ක්‍රීඩාකරන්ට ; උස්සාහා, උත්සාහ ඇත්තී (නොහොත්) උත්සාහයෙන් ; තං වනං, ඒ වනයට ; පවිසිත්වාන, ප්‍රවිෂ්ටව ; කීළන්තී, ක්‍රීඩාකරන්නී ; මඞ්ගලං සාලපාදපං, මඟුල්සල්රුකක් වෙත ; උපගන්ත්වාන, පැමිණ.

33. සා, ඒ මායාදේවීතොමෝ ; සුරත්ත, අතිරක්තවූ ; කරපල්ලවා, අත්තල නැමති ලපලුපතින් ; විලොල, විශෙෂයෙන් චචලවූ ; පල්ලවාකිණ්ණං, ලපලුයෙන් ගැවසී ගත්තාවූ ; සුඵුල්ල, සුප්‍රඵුල්ලවූ ; කුසුමොනතං, පුෂ්පභාරාවනතවූ ; සාලසාඛං, සල්අත්තක් ; ගහෙත්වා, ගෙණ.

34. සදෙවකෙ, දෙවියන්සහිත ලොකයා ; මහමානෙ, පුන්විඩි පවත්වන කල්හි ; තනුජා, ඒ සල්රුක වෙත සිටියාවූ ; මායා, මහාමායාදේවීතොමෝ ; දෙවෙහි, දෙවියන් විසින් ; ගහිතාරක්ඛා, ගන්නාලද ආරක්ෂා ඇත්තී ; ලොකලොචනං, තිලොවට නෙත්‍රයක් වැනිවූ ; තනයං, පුත්‍රරත්නය ; ජනෙසි, වැදූ.

35. බ්‍රහ්මාණො ලොකපාලා ච මනුස්සා කමතො තදා,
සොණ්ණජාලාජිනාදීහි ගණ්හිංසු ජනනන්දනං.

36. මහිං පතිට්ඨිතො ධීරො පෙක්ඛමානො තතො දිසා,
උත්තරාභිමුඛො සත්තපදං ගන්ත්වාම්බුජෙ ඨිතො.

37. දිසානමවලොකෙන්තො ඵුල්ලම්බුජලොචනො,
නිච්ඡාරෙසාසභිං වාචං අග්ගො සෙට්ඨො'ති ආදිනා.

38. බ්‍රහ්මාමරනරාදීහි පූජිතො ච නමස්සිතො,
කමෙන අභිවඩ්ඪන්තො පුණ්ණපක්ඛෙව සසී යථා.

---

35. තදා, එකල්හි; බ්‍රහ්මාණො, බ්‍රහ්මරාජයෝද; ලොකපාලාච, ලොකපාල දෙවියෝද; මනුස්සාච, (උතුම්) මනුෂ්‍යයෝද; සොණ්ණජාල, රන් දැල්ය; අජිනාදීහි, අඳුන්දිවි සම් යන මේ ආදින්; කමතො, අනුක්‍රමයෙන්; ජනනන්දනං, ජනානන්දකරවූ මහාබෝධිසත්වයන්වහන්සේ; ගණ්හිංසු, පිළිගත්තුය.

36. තතො, ඉක්බිත්තෙන්; ධීරො, ප්‍රාඥවූ ඒ මහාබෝධිසත්වතෙම; මහිං, පෘථිවියෙහි; පතිට්ඨිතො, පිහිටියේ; දිසා පෙක්ඛමානො, දිශා විලෝකනය කොට; උත්තරාභිමුඛො, උත්තර දිශාභිමුඛව; සත්තපදං, සත් පියවරක්; ගන්ත්වා, ගොස්; අම්බුජෙ, (සත්මුලු) පියුම් පිට; ඨිතො, සිටියේය.

37. ඵුල්ල, ප්‍රඵුල්ලවූ; අම්බුජලොචනො, නීලොත්පල වැනි නෙත් ඇති මහබෝසත්තෙම; දිසානං, දිශාන්තය; අවලොකෙන්තො, විලෝකනය කොට; "**අග්ගො සෙට්ඨො**" ඉති, අග්‍රයෙමි ශ්‍රේෂ්ඨයෙමි; ආදිනා, මේආදින්; ආසභිං, නිර්භීතවූ; වාචං, වචනයක්; (නොහොත්) ආසභිංවාචං, අභීතසිංහනාදයක්; නිච්ඡාරෙසි, නිකුත්කළසේක (නොහොත් වදාළසේක.)

38. බ්‍රහ්ම, බ්‍රහ්මරාජයෝය; අමර, දෙවියෝය; නර, මනුෂ්‍යයෝය; ආදීහි, යන මේ ආදින් විසින්; පූජිතො ච, පුදනලද්දේද; නමස්සිතොච, නමස්කාර කරණලද්දේ; පුණ්ණපක්ඛෙ; ශුක්ලපක්ෂයෙහි; සසී යථා, චන්ද්‍රයා මෙන්; කමෙන, ක්‍රමයෙන්; අභිවඩ්ඪන්තො, වැඩෙන්නේ.

39. බ්‍රහ්මුනං ජනතාජායාය මන්දාරකුසුමන්තරෙ,
සාතායාමන්දදෙවෙහි ධුතචාමරමජ්ඣගො.

40. දිබ්බෙහි රූපසද්දෙහි ගන්ධෙහි ච රසෙහි ච,
ඵොට්ඨබ්බෙහි ච දිබ්බෙහි මොදමානො අනෙකධා.

41. දිබ්බෙහි රමණීයෙහි නච්චෙහි වාදිතෙහි ච,
පදගෙයසහස්සෙහි පූජමානගුණාකරො.

42. පත්තො සොළසමං වස්සං ඤාතිසඞ්ඝස්ස මජ්ඣගො,
දස්සෙසා'සෙසසිප්පං තං ලොකෙ විජ්ජති යං තදා.

---

39. බ්‍රහ්මුනං, බ්‍රහ්මයන්ගේ ; ජනතාජායාය, ජේසත් සෙවණෙහි ; මන්දාරකුසුමන්තරෙ, මදාරමල් අතුරෙහි ; සාතායා, සන්තොෂසහිතාවූ; අමන්ද, ඉතා බොහෝවූ ; දෙවෙහි, දෙවියන් විසින් ; ධුත, සලනලද ; චාමරමජ්ඣගො, චල්විදුනා මධ්‍යගතවූයේ.

40—41. දිබ්බෙහි, දෙවියන්විසින් පරිභොගකටයුතුවූ; රූපසද්දෙහිච, රූපයෙන් හා ශබ්දයෙන්ද ; ගන්ධෙහිච, සුගන්ධයෙන්ද ; රසෙහිච, රසයෙන්ද; දිබ්බෙහි, දිව්‍යවූ; ඵොට්ඨබ්බෙහිච, ස්පෘෂ්ටව්‍යයෙන්ද ; දිබ්බෙහි, දිව්‍යවූ ; රමණීයෙහි, සිත්කලුවූ ; නච්චෙහි, නෘත්‍යයෙන්ද ; වාදිතෙහිච, වාද්‍යයෙන්ද ; අනෙකධා, අනෙකප්‍රකාරයෙන් ; මොදමානො, සතුටුවන්නේ; අනෙක පදගෙය සහස්සෙහි, නොයෙක් දහස්ගණින් පද්‍යයෙනුදු ; පූජමාන, සත්කාරපූජාලබන්නාවූ ; ගුණ, ගුණයන්ට; ආකරො, උත්පත්තිස්ථාන වූයේ.

42. ඤාතිසඞ්ඝස්ස, ඥාතිසමූහයාගේ ; මජ්ඣගො, මධ්‍යගතවූ ඒ මහාබොධිසත්වතෙම ; සොළසමංවස්සං, සොළොසැවිරිදිවය සට; පත්තො, පැමිනි; තදා, එකල්හි; ලොකෙ, ලොකයෙහි ; යං, යම් ශිල්පයක් ; විජ්ජති, විද්‍යමානවේද ; තං අසෙසසිප්පං, ඒ සියලු ශිල්ප ; දස්සෙසා, දක්වා.

43. සුතිසඞ්ඝං පමොදයන්තො දෙවෙ ච මනුජෙපි ච,
ලබ්භා යසොධරං දෙවිං 'නුකූලං ජයිජයං.

44. සොණ්ණදප්පණසඞ්කාස සොම්මානන විභූසිතං,
නීලනීරජසඞ්කාසවිසාලායතලොචනං.

45. සිඞ්ගාරමන්දිරවාරෙ ධජොපමභමුවයං,
හෙමකාහලසඞ්කාස නාසිකං රූපලක්ඛියා.

46. නීලවෙල්ලිතධම්මිල්ල ජීමූතොභයකොටිකං,
නිච්චවිජ්ජුල්ලතාවඞ්කමනුඤ්ඤකණ්ණපාසකං.

---

43. සුතිසඞ්ඝං, නෑසමූහයාද; දෙවෙ ච, දෙවියන්ද; මනුජෙපි ච, මනුෂ්‍යයන්ද; පමොදයන්තො, සතුටුවන්නේ; ජයිජයං, ජයයෙන් ජයයෙහි; අනුකූලං, චිත්තානුකූලවූ; යසොධරං දෙවිං, යශොධරා නම් දේවිය; ලබ්භා, ලැබ; (කෙබඳු යශොධරා නම් දෙවියක් ලබාද යත්)

44. සොණ්ණදප්පණ සඞ්කාස, රන්කැටපත්බඳුවූ; සොම්ම, සෞම්‍යවූ; ආනන, මුහුණින්; විභූසිතං, විභූෂණයෙන් අලඞ්කෘතවූ; නීල නීරජ සඞ්කාස; නිලුපුල් සමානවූ; විසාල, පුළුල්වූ; ආයත, දික්වූ; ලොචනං, නෙත් ඇත්තාවූ.

45. රූපලක්ඛියා, රූපශ්‍රීයගේ; සිඞ්ගාර මන්දිරවාරෙ, නෘත්‍යශාලාවාරයෙහි (බඳිනලද්දාවූ): ධජෝපම, ධ්වජයක් බඳුවූ; භමුවයං, භෲයුගමයක් ඇත්තාවූ; හෙමකාහලසඞ්කාස, රන්කාලමකට බඳුවූ; නාසිකං, නාසයක් ඇත්තාවූ.

46. නීල, නිල්පැහැ ඇත්තාවූ; වෙල්ලිත, අග්බමුරුවූ; ධම්මිල්ලං, කෙශකලාප නැමති; ජීමූත, මෙඝයාගේ; උභය කොටිකං, දෙකෙළවරෙහි; නිච්ච, නිරන්තරයෙන් (පවත්නාවූ); විජ්ජුල්ලතා වඞ්ක, විදුලි කලඹක් මෙන්; මනුඤ්ඤං, මනොඥවූ; කණ්ණපාසකං, (සොභමාන) කන්වැල් සගලක් ඇත්තාවූ

47. සාතකුම්භඝනිභාභාසපයොධරඝටද්වයං,
සුවණ්ණද්දිතටායාතනිජ්ඣරාකාරහාරකං.

48. දෙහදෙවද්දුමාලම්බ පාරොහාභභුජද්වයං,
අඞ්ගුලිපල්ලවග්ගාම්බු බින්දුචාරුනඛාවලිං.

49. දෙහමාලාලිමාලාභ රොමරාජිවිරාජිතං,
රූපණ්ණවතරඞ්ගාභ වලිත්තයවිචිත්තකං.

50. සොණ්ණරම්භාසමාවට්ට පීණොරුද්වයසුන්දරං,
සනාගීරකලිකාකාරචාරුජඞ්ඝාවිභූසිතං.

---

47. සාතකුම්භඝනීභ, උතුම්වූ ස්වර්ණවර්ණයෙන් මෙන්; අභාස, බැබළුම් ඇත්තාවූ; පයොධර, පියයුරු නැමති; ඝටද්වයං, පුන්කලස් දෙකක් ඇත්තාවූ ; සුවණ්ණද්දිතට, ස්වර්ණ පර්වතතටයෙකින් ; අයාත, පැමිණියාවූ; නිජ්ඣරාකාර, ගඟුල් ඇල්ලක් බඳුවූ ; හාරකං, මුක්තාහාර ඇත්තාවූ.

48. දෙහ, ශරීර නැමති ; දෙවද්දුම, සුරතුරෙහි ; අලම්බ, (හටගෙණ) එල්ලෙන්නාවූ ; පාරොහාභ, අරළුවැනිවූ ; භුජද්වයං, බාහුයුගමයක් ඇත්තාවූ ; අඞ්ගුලි, ඇඟිලි නැමති ; පල්ලවග්ග, පළුපත් අග ලැසිගත් ; අම්බුබින්දු, දියබිඳු බඳුවූ ; චාරු, මනොඥවූ ; නඛාවලිං, නියපඞ්ක්තිය ඇත්තාවූ.

49. දෙහමාලා, ශරීර නැමති මල්දමිණි ; අලිමාලාභ, භෘඞ්ග මාලාවකට බඳුවූ ; රොමරාජි, රොමශ්‍රෙණීන් ; විරාජිතං, හෙබියාවූ ; රූපණ්ණව, රූප නැමති සාගරයාගේ ; තරඞ්ගාභ, රළ පන්තියක් වැනිවූ; වලිත්තය, වලිත්‍රයකින් ; විචිත්තකං, විසිතුරුවූ.

50. සොණ්ණරම්භා, ස්වර්ණකදලීස්තම්භයක් මෙන් ; සමාවට්ට, මොනවට වටවූ ; පීණ, පිරුණුවූ ; ඌරුද්වය, සක්ථි යුගලයෙන් ; සුන්දරං, සොඳුරුවූ ; සනනීරකලිකාකාර, තැඹිලි මල්කැකුළු බඳුවූ ; චාරු, මනොඥවූ ; ජඞ්ඝා, කෙණ්ඩායුගම යෙන් ; විභූසිතං, අලඞ්කෘතවූ.

51. පච්චක්ඛරූපලක්ඛිං'ව ලීලාභිවසභගාමිනං,
ගුණානමාකරං සාධු වෙලං'ව රතිසාගරෙ.

52. කන්තො වසන්තරාජා'ව කන්දප්පො'ව සුරූපවා,
සසී'ව දස්සනීයො ච සුරියො විය තෙජවා.

53. අචලත්තෙන මෙරූ'ව ගම්භීරෙනණ්ණවො විය,
බ්‍රහ්මස්සරො පියංවාදී පඤ්ඤාය ච අනූපමො.

54. වසන්තො සො මහාවීරො පුරස්මිං කපිලව්හයෙ,
දිස්වා නිමිත්තෙ චතුරො උය්‍යානගමනප්පථෙ.

---

51. පච්චක්ඛ, ප්‍රත්‍යක්ෂවූ ; රූප, රූඇති ; ලක්ඛිං ඉව, ශ්‍රී දේවිය වැනිවූ ; ලීලාභිවසභගාමිනං, ලීලා පුජයන් වැනිවූ ; ගුණානං, (සීලාදි) ගුණයන්ට ; ආකරං, උත්පත්තිස්ථානවූ ; රතිසාගරෙ, රති සයුරෙහි ; සාධු, යහපත්වූ ; වෙලංඉව ; වෙරළක් වැනිවූ ; (යසොධරං දෙවිං, යශොධරා නම් දෙවියන් ; ලබා, ලැබ).*

52. වසන්තරාජා ඉව, වසන්රජු මෙන් ; (3) කන්තො, මනොඥවූ ; සුරූපවා, යහපත්රූ ඇති ; කන්දප්පො ඉව, අනඞ්ගයා මෙන්වූ ; සසීඉව, චන්ද්‍රයා මෙන් ; දස්සනීයොච, දැකුම කට සුතුවූ ; සුරියො විය, සූර්‍ය්‍යයාමෙන් ; තෙජවා, තෙජස් ඇත්තාවූ.

53. අචලත්තෙන, නිශ්චලභාවයෙන් ; මෙරූ ඉව ; මහා මෙරුපර්වතය වැනිවූ ; ගම්භීරෙන, ගැඹුරු ගුණයෙන් ; අණ්ණවොවිය, සාගරය වැනිවූ ; බ්‍රහ්මස්සරො, බ්‍රහ්මධ්වනි ඇත්තාවූ ; පියංවාදී, ප්‍රියතෙපුල් බණනා සුලුවූ ; පඤ්ඤායච, ප්‍රඥාවෙන්ද ; අනූපමො, උපමා රහිතවූයේ.

54. කපිලව්හයෙ පුරස්මිං, කපිලවස්තු නම්වූ පුරප්‍රවරයෙහි ; වසන්තො, වාසයකරන්නාවූ ; සො මහාවීරො, ඒ මහාවීරවූ බොධිසත්වතෙම ; උය්‍යානගමනප්පථෙ, උයන්යන මාර්ගයෙහිදී ; චතුරො නිමිත්තෙ, (ජරාය, රොගය, මෘතය, ප්‍රව්‍රජිතය යන) සිවුවැදෑරුම් නිමිති (රූපයන්) ; දිස්වා, දැක.

---

* "සමීපො'පි න සම්බන්ධො අසම්බන්ධ සභාවතො
දූරතො'පිච සො හොති චන්ද්‍රජාවිය සමාගරං." යි
කියනලද හෙයින් "යසොධරං දෙවිං ලබා" යනු සම්බන්ධයි.

59. සමීරසිසිරොළාර ධාරාසීකරවාරිහි,
ධාරාමණ්ඩපපන්තීහි ජනානන්දකරං වරං.

60. උය්‍යානවනමාගම්ම දෙවරාජාව නන්දනං,
කීළන්තො නිජපුත්තස්ස සුත්වාන ජාතසාසනං.

61. නිවත්තෙන්තො විස්සකම්මෙන සහස්සනෙත්තොව භූසිතො,
පුරං පවිසමානොව කිසාගොතමිභාසිතං.

62. සුත්වාන නිබ්බුතපදං* තදා චිත්තානුකූලකං,
සන්තුට්ඨො සානුරාගොව ලක්ඛග්ඝං තාරභාසුරං.

---

59. සමීර, මාරුතයෙන්; සිසිර, සිහිල්වූ; උළාර, මහත්වූ; ධාරා, ජලධාරාවෙන්ද; සීකරවාරිහි, ජලකණිකා ජලයෙන්ද; ධාරාමණ්ඩපපන්තීහි, ජලයන්ත්‍රමණ්ඩපපෙළින්ද; ජනානන්දකරං, ජනයාගේ චිත්තානන්දකරවූ; වරං, උතුම්වූ.

60. උය්‍යානවනං, උයන්වනයට; ආගම්ම, පැමිණ; නන්දනං, නන්දනොද්‍යානයට (පැමිණියාවූ); දෙවරාජා ඉව සක්දෙව්රජු සෙයින්; කීළන්තො, ක්‍රීඩාකරන්නේ; නිජපුත්තස්ස, තම පුතුගේ; ජාතසාසනං, උපන් හස්න; සුත්වාන, අසා.

61. නිවත්තෙන්තො, නැවැත්තේ; විස්සකම්මෙන, විශ්වකර්මයා විසින්; භූසිතො, සරසනලද්දේ; සහස්සනෙත්තො ඉව, ශක්‍රදෙවෙන්ද්‍ර විලාසයෙන්; පුරං, පුරයට; පවිසමානොව, (පෙරලා) ප්‍රවිෂ්ටවන්නේම; කිසාගොතමි භාසිතං, කෘශාගෞතමීන් විසින් කියනලද්දාවූ.

62. තදා, එකල්හි; චිත්තානුකූලකං, චිත්තානුරූපවූ; නිබ්බුතපදං, (**"නිබ්බුතා නූන සා මාතා"** යනාදීන් ප්‍රකාශිත) නිර්වෘතපදය; සුත්වාන, අසා; සන්තුට්ඨො, සතුටුවූයේ; සානුරාගොව, අනුරාගසහිත සිත් ඇත්තේ; ලක්ඛග්ඝං, ලක්‍ෂයක් අගනාවූ; තාර, මහත්වූ; භාසුරං, බබලන්නාවූ.

---

* "නිබ්බුතිපදං."

63. හාරං තිස්සාය පෙසෙත්වා ගන්ත්වාන සකමන්දිරං,
දෙවරජ්ජවිලාසෙන නිසීදි පවරාසනෙ.

64. අථාගම්ම තදා නෙකනාටිකා පරිවාරයුං,
වජ්ජන්ති භෙරියො තාසු පගායන්ත කාචි නාරියො.

65. නානාලයසමාකිණ්ණං ගීතං ගායන්ති කාචිපි,
ධමන්ති සුසිරං කාචි කාචි වාදෙන්ති තන්තියො,*

66. චාරුබිම්බාධරා රම්මපයොධරභරා සුභා,
විසාලායතනීලක්ඛා සොම්මසොම්මානනා තදා.

---

63. හාරං, මුක්තාහාරය; තිස්සාය, ඒ කෘශාගෞතමියට; පෙසෙත්වා, යවා; සකමන්දිරං, ස්වකීය භවනයට; ගන්ත්වාන, ගොස්; දෙවරජ්ජවිලාසෙන, ශක්‍රදෙවේන්ද්‍රාකාරයෙන්; පවරාසනෙ, උත්තමාසනමස්තකයෙහි; නිසීදි, වැඩහුන්සේක.

64. අථ, ඉක්බිත්තෙන්; තදා, එකල්හි; අනෙකනාටිකා, නොයෙක් නලඟනෝ; අගම්ම, එළඹ; පරිවාරයුං, පිරිවැරූහ; තාසු, ඔවුන්අතුරෙන්; කාචි නාරියො, ඇතම් ස්ත්‍රීහු; භෙරියො, භෙරින්; පගායන්ත, ගෙණ; වජ්ජන්ති, වයත්.

65. කාචි අපි, ඇතම් තැනැත්තියෝද; නානාලය සමාකිණ්ණං, අනෙක තාලයෙන් ගැවසුනාවූ; ගීතං, ගීතිකා; ගායන්ති, ගායනාකෙරෙත්; කාචි, සමහරු; සුසිරං, කුලල් (නලා); ධමන්ති, පිඹිත්; කාචි, සමහරු; තන්තියො, තතන්ත්‍රීන්; වාදෙන්ති, වාද්‍ය කෙරෙත්.

66. තදා, එසමයෙහි; චාරු, මනොඥවූ; බිම්බඅධරා, බිඹුපල වැනි තොල් ඇත්තාවූ; රම්ම, සිත්කලුවූ; පයොධරභරා, පියපුරින් බරවූ; සුභා, සොභමානවූ, විසාල, මහත්වූ; ආයත, දික්වූ; නීලඅක්ඛා, නිල්වන් ඇස්ඇත්තාවූ; සොම, චන්ද්‍රයා වැනිවූ; සොම්මආනනා, සෞම්‍ය වක්ත්‍ර ඇත්තාවූ.

---

* "කාචි තන්ති වයන්ති ච"

67. නච්චන්ති පුරතො තස්ස හෙරම්බලමජ්ඣගා,
දෙවකඤ්ඤාව රඞ්ගම්හි රසභාවනිරන්තරං.*

68. දිස්වාන සො තමච්ඡරියං විරතො හො විසයෙ තදා,
උරගාලං'ව අද්දක්ඛි සබ්බන්තං හෙරම්බාලනං.

69. පරිදෙවං'මුපඤ්ඤාසි ගීතං සංසාරසාගරෙ,†
වායුවෙගවිකාරං'ව නච්චං විඤ්ඤාසි නායකො.

---

67. හෙරම්බල මජ්ඣගා, බෙරම්බුලුමැදට පැමිණි නළඟනෝ : දෙවකඤ්ඤා ඉව, දිව්‍ය කන්‍යාවන් මෙන් : රඞ්ගම්හි, රඞ්ගමඩුල්ලෙහි ; තස්ස, ඒ මහබෝසතුන්ගේ ; පුරතො, ඉදිරියෙහි : රසභාවනිරන්තරං, (අෂ්ටවිධ) නාට්‍යරසයෙන් හා ‡ (අෂ්ටවිධ) නාට්‍යභාවයෙන් ‖ නිරතුරුකොට ; නච්චන්ති, නටත්.

68. තදා, එකල්හි ; සො, ඒ මහබෝසත්හෙම ; තං අච්ඡරියං : ඒ ආශ්චර්යය ; දිස්වාන, දැක ; විසයෙ, කාමයෙහි ; විරතො, නොඇලුණේ ; තං සබ්බං හෙරම්බාලනං, ඒ සියලුබෙර වැයීම ; උරගාලං ඉව, ලෙහි ගැසීමක් මෙන්; අද්දක්ඛි, දිටි.

69. ගීතං, ගීතිකාව ; පරිදෙවං ඉව, විලාපයක් සෙයින් ; උපඤ්ඤාසි , එලැඹිය ; නායකො, ලොකනායකතෙම ; සංසාර සාගරෙ, සසරනැමති සයුරෙහි ; වායුවෙග විකාරං ඉව, වාත වෙගයෙන් හටගත් විකාරයක් මෙන් ; නච්චං, නෘත්‍යය ; විඤ්ඤාසි, සිතී.

---

* "රසභාවනිරන්තරා"

† "සංසාරදුත්තරෙ"

‡ "ශෘඞ්ගාර, හාස්‍ය, කරුණ, රෞද්‍ර, වීර, භයානකාඃ බීභත්සාද්භුත ඉත්‍යෂ්ටෞ මතාමෙතා හෙ බුද්ධිගවරෛඃ" යි ශෘඞ්ගාරරසය අෂ්ටවිධ කොට දැක්වුවද, ආචාර්ය්‍ය මෞද්ගල්‍යායන යන් විසින් "සිංගාරෙ කරුණෙ" යනාදීන් නවභාවරසයෙහි දක්වනලදි.

‖ "භාසයව, ශොකයව, ක්‍රොධ, උත්සාහභාසාහයං තථා ජුගුප්සාවිස්මයචාෂ්ටෞ ස්ථායිභාවා ඉමෙ මතාඃ" යි අෂ්ටවිධභාවය උක්තයි.

70. **කදාහං ඝරමොස්සජ්ජ පබ්බජ්ජාසිද්ධිමුබ්බහෙ,**
**ඉච්චෙවං චින්තයන්තො සො සුපන්තොව වසී තහිං.**

71. **යං නිස්සාය මයං එත්ථ නච්චගීතෙසු වත්තිමා,**
**සො'යං දානි සුපී අම්හෙ කස්ස දානි කරොම තං.**

72. **ඉති චින්තිය තෙ තත්ථ තුරියෙසු සකෙ සකෙ,**
**ආලම්බා සයිතා කඤ්ඤා, සුසඤ්ඤඤ්ඤමඤ්ඤමනිස්සිතා.**

73. **ඛාදන්තා කාචි දන්තානි කාචි ලාලා වහන්තියො,**
**කාචි රුදන්තියො තත්ථ විලපන්ති අථාපරා.**

---

70. අහං, මම ; කදා, කවරනම් දිනයෙක්හි ; ඝරංඔස්සජ්ජ, ගිහිගෙයහැර ; පබ්බජ්ජාසිද්ධිං, ප්‍රව්‍රජ්‍යාශ්‍රිය ; උබ්බහෙ, ලත්තෙම්දෝහෝයි ; ඉති එවං, මෙසේආකාරයෙන් ; චින්තයන්තො, සිතන්නාවූ ; සො, ඒ මහබෝසත්තෙම ; සුපන්තො ඉව, නිදන්නෙක් මෙන් ; තහිං, එහි ; වසී, හොත්තේයි.

71. මයං, අපි ; එත්ථ, මෙහි ; යංනිස්සාය, යමෙක්නිසා ; නච්චගීතෙසු, නැටුම් ගී කීම්හි ; වත්තිමා, ප්‍රවෘත්තවූවෝ වෙමුද ; සො අයං, ඒ මේ මහාසත්වතෙම ; ඉදානි, දැන් ; සුපී, සයනය කෙළේය ; අම්හෙ, අපි ; කස්ස, කවරෙක්හට ; තං, ඒ නැටුම ගීතිකා ; ඉදානි, දැන් ; කරොම, කරමුද.

72. ඉති, මෙසේ ; චින්තිය, සිතා ; තෙ සකෙ සකෙ තුරියෙසු,* ඒ ස්වකීය ස්වකීය තූර්‍ය්‍යයන් ; ආලම්බා, එල්බුනාවූ ; සුසඤ්ඤා, යහපත් සංඥද ; අඤ්ඤං, (අරමුණු) දුන්මද ; අනිස්සිතා, ඇසුරු නොකළාවූ ; (නොහොත්) සුසු, තරුණවූ ; කඤ්ඤා, කන්‍යාවෝ ; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන් ; අනිස්සිතා, නිශ්‍රිත නුවූවාහු ; තත්ථ, ඒ රඟමඬුල්ලෙහි ; සයිතා, සයනය කළාහුයි.

73. කාචි, ඇතැම් නැනැත්තියෝ ; දන්තානි, දත් ; ඛාදන්තා, කන්නියෝය ; කාචි, ඇතැම් නැනැත්තියෝ ; ලාලා වහන්තියො, (කුණු) කෙළ වගුරුවන්නියෝය ; කාචි, සමහර රුදන්තියො, හඬන්නියෝය ; අථ, තවද ; තත්ථ, එහි, අපරා, අන්නැනැත්තියෝ ; විලපන්ති, වැලපෙත්.

---

* "සු" නිපාතයි.

74. කාකච්ඡන්ති'පි සෙම්හාපි ගිලන්ති ච වමන්ති ච,
කරොන්ති නාදං නාසාය ඝරූ'ති ච ඛිපන්ති ච.

75. මුත්තාපෙන්ති තදා තාවි රහස්සං විවරන්ති ච,
දුග්ගන්ධං වාති තං ඨානං සුසානං ආමකං යථා.

76. පබුද්ධො අඩ්ඪරත්තම්හි ගතෙ තත්ථ නිසීදිය,
අද්දක්ඛි තාසං නෙකානි විකාරානි තහිං තදා.

77. තස්සෙවං පෙක්ඛමානස්ස භවෙ සංවිග්ගචෙතසො,
ආදිත්තංව උපට්ඨාසි මනෙ ඛලු භවත්තයං.

---

74. අපි, යළිත්; කාකච්ඡන්ති, (සමහරක්) තළිත්; සෙම්හාපි, සෙම්ද; ගිලන්තිච, (සමහරක්) ගිලිත්; වමන්තිච, (සමහරක්) වමාරත්; නාසාය, නාසිකාවෙන්; ඝරූ ඉති, "ඝරූ" යන; නාදංච, ශබ්දයද; කරොන්ති, කෙරෙත්; ඛිපන්තිච, කිවිසිත්.

75. තදා, එකල්හි; තාවි, කිසියම් ස්ත්‍රීහු; මුත්තාපෙන්ති, මුත්‍රකෙරෙත්; රහස්සං, ගුහ්‍යස්ථානය; විවරන්තිච, විවෘතද කෙරෙත්; තං ඨානං, ඒ ස්ථානය; ආමකංසුසානං යථා, අමු සොහොනක් මෙන්; දුග්ගන්ධං වාති, දුගඳ හමයි.

76. තදා, එකල්හි; අඩ්ඪරත්තම්හි, මධ්‍යමරාත්‍රිය; ගතෙ, (ඉක්ම) ගියකල්හි; පබුද්ධො, ප්‍රබුද්ධවූ ඒ මහාසත්වතෙම; තත්ථ, එහි; නිසීදිය, වැඩහිඳ; තහිං, ඒ රඟමඩලෙහිවූ; තාසං, ඒ ස්ත්‍රීන්ගේ; නෙකානි විකාරානි, නොයෙක් විකාරයන්; අද්දක්ඛි, දිටී.

77. එවං, මෙසේ; පෙක්ඛමානස්ස, බලන්නාවූ; භවෙ, සංසාරයෙහි; සංවිග්ගචෙතසො, සංවෙගයට පැමිණි සිත් ඇත්තාවූ; තස්ස, ඒ මහබෝසතුන්ගේ; මනෙ, සිත්හි; භවත්තයං, තුන්ලොව; ඛලු, ඒකාන්තයෙන්; ආදිත්තංඉව, ගිනි ඇවිලගත්තක් මෙන්; උපට්ඨාසි, වැටහුනේය.

78. ධූමාකුලසමාදිත්තා* මහාරඤ්ඤා යථා ගජො,
තථෙවාසි නරින්දස්ස ගෙහතො ගමනෙ මති.†

79. තතො වුට්ඨාය සයනා කරොන්තො අභිනික්ඛමං,
චින්තෙසාහි මහාරාජා පස්සිතුං සකමත්‍රජං.

80. පවිසිත්වා තතො ගබ්භං සණිකං සන්තමානසො,
පස්සිත්වා සහ පුත්තෙන නිද්දායන්තිං යසොධරං.

81. චිරගතං මහාපෙමං ධාරයං සකමානසෙ,
බුද්ධො හුත්වාපිමං සක්කා පස්සිතුං ඉති චින්තිය.

---

78. ධූමාකුල, ලැව්ගින්නෙන් ; සමාදිත්තා, අතිශයින් ඇවිල ගෙණ දිලියෙන්නාවූ ; මහාඅරඤ්ඤා, මහවනයකින් (නික්මෙන්නාවූ) ; ගජෝ යථා, හස්තියෙක් යම්සේද ; තථාඑව, එ පරිද්දෙන්ම ; නරින්දස්ස, නරේන්ද්‍රවූ මහාබොධිසත්ත්වයන්ට ; ගෙහතො, (තම ගිහි) ගෙන් ; ගමනෙ, (නික්ම) යාමෙහි (අභිනික්මණයෙහි) ; මති, අදහසක් ; ආසි, වී.

79. තතො, ඉක්බිති ; සයනා උට්ඨාය, ශයනයෙන් නැගිට ; අභිනික්ඛමං කරොන්තො, මහබිනික්මන් කරන්නාවූ ; මහාරාජා, මහාරජවූ ඒ මහාබොධිසත්ත්වතෙම ; සකං අත්‍රජං, ස්වකීය පුත්‍රයා ; පස්සිතුං, දක්නට ; චින්තෙසයි, චින්තනාකළේය (හෙවත්) සිතූසේක.

80. තතො, ඉක්බිත්තෙන් ; සන්තමානසො, සන්සුන් සිත් ඇති මහබෝසත්තෙම ; සණිකං, සෙමින් ; ගබ්භං, සැතපෙන ගෙට ; පවිසිත්වා, ප්‍රවිෂ්ටව ; පුත්තෙනසහ, පුත්‍රයා සමග ; නිද්දායන්තිං, නිදන්නාවූ ; යසොධරං, බිම්බාදේවීන් ; පස්සිත්වා, බලා.

81. චිරගතං, දීර්ඝකාලයක පටන් පැවත අවාවූ ; මහාපෙමං, මහත්වූ ප්‍රෙමය ; සකමානසෙ, සියසිත්හි ; ධාරයං, දරමින් ; බුද්ධොහුත්වාපි, බුදුවද ; ඉමං, මේ (පුත්‍රයා) ; පස්සිතුං, දක්නට ; සක්කා ඉති, හැකියයි ; චින්තිය, සිතා.

---

* "ධූමග්ගිදඩ්ඪනාදිත්තා."

† "මතං."

82. ගතො නාථො තතො ඨානා බොධියාබද්ධමානසො*
තදහෙවාසි බුද්ධො'ති සාමුකො සො න විම්හයෙ.

83. සිනෙරුමුද්ධරන්තොව පාදුද්ධරිය නික්ඛමං,
ජනනමාහුය ආනීතං කණ්ඨකං තුරගාධිපං.

84. අස්සරජ්ජං තමාරුය්හ සහ ජනෙනන රත්තියං,
දෙවෙහි විවටද්වාරා පටිපජ්ජි මහාපථං.

85. චක්කවාලෙසු නෙකෙසු දෙවතා සුසමාගතා,†
දීපධූපධජෙහෙව ගන්ධමාලෙහි‡ පූජයුං.

---

82. බොධියාබද්ධමානසො, සම්‍යක්සම්බොධිය කෙරෙහි බැඳුනු සිත් ඇති; නාථො, ලොකස්වාමිවූ මහාසත්වතෙම; තතොඨානා, එතැනින්; ගතො, (නික්ම) වැඩියේක; තද හෙව, එදවසම; බුද්ධො ආසි ඉති, බුදුවූසේකැයි; සො සාමුකො, තවරනම් සාමි පුද්ගලයෙක්; න විම්හයෙ, නොසිතාද; (සිතාමය).

83. සිනෙරුං, මහමෙර; උද්ධරන්තො ඉව, උදුරන්නාක් මෙන්; පාදං, පාදය; උද්ධරිය, උදුරා; (පසතබා); නික්ඛමං, මහබිනික්මන් නික්මෙන්නේ; ජනනං, ජනනනම් ඇමතියා; ආහුය, කැඳවා; ආනීතං, ගෙණඑනලද; තුරගාධිපං, තුරගශ්‍රෙෂ්ඨවූ; කණ්ඨකං, කණ්ඨක නම්වූ.

84. තං අස්සරජ්ජං, ඒ අශ්වරාජයාපිට; ආරුය්හ, නැගී; ජනෙනන සහ, ජනන නම් අමාත්‍යයා සමග; රත්තියං, (මධ්‍යම) රාත්‍රියෙහි; දෙවෙහි, දෙවියන්විසින්, විවටද්වාරා, හල දෙරින් (නික්ම); මහාපථං, මහාවීථිමාර්ගයට; පටිපජ්ජි, පිළිපැද්දේය.

85. අනෙකෙසු චක්කවාලෙසු, නොයෙක් සක්වළ; දෙවතා, දෙවියෝ; සුසමාගතා, රැස්වූවාහු; දීපධූපධජෙහිඑව, පහන් දුම් කොඩියෙන්ද; ගන්ධමාලෙහි, සුවඳමලින්ද; පූජයුං, පිදූ.

---

* "බොධිබද්ධාවමානසා." † "දෙවතායුං සමාගතා."
‡ "දීපධූපධජෙවච ගන්ධමාලෙව."

86. පුරතො සට්ඨිසහස්සානි දණ්ඩදීපානි ධාරයුං,
තථා දක්ඛිණපස්සම්හි වාමපස්සෙ ච පච්ඡතො.

87. ගගනා පුප්ඵවස්සානි වස්සාපෙසුං සදෙවකා,*
මන්දාරවං කොකනදං සුගන්ධං චිත්තපාටලිං.

88. චම්පකාසොකපුන්නාග නාගපූගාගසම්භවං,
මාලතීවස්සිකීයාදි නානාවල්ලීහි සම්භවං.

89. පදුමුප්පලකල්හාර කුමුදද්‍යාම්බුසම්භවං,
සුගන්ධමධුමත්තාහි ඡප්පදාලීහි කූජිතං.

---

86. පුරතො, ඉදිරියෙහි; සට්ඨිසහස්සානි, සැටදහසක් පමණ; දණ්ඩදීපානි, දඬුවැටපහන්; ධාරයුං, දැරූහ; තථා, එසේම; දක්ඛිණපස්සම්හි, දකුණුපස්හිද; වාමපස්සෙ ච, වම් පස්හිද; පච්ඡතො, පිටිපස්හිද; [දණ්ඩදීපානි, දඬුවැට පහන්; ධාරයුං, දැරූහ].

87. සදෙවකා, දෙවියන්සහිත ජනයෝ; ගගනා, අහ සින්; සුගන්ධං, සුවඳැත්තාවූ; මන්දාරවං, මඳාර (පරසතු) ය; කොකනදං, රත්පියුම්ය; චිත්තපාටලිං, චිත්‍රපාටලිය (යන මේ); පුප්ඵවස්සානි, මල්වැසි; වස්සාපෙසුං, වැස්සූහ.

88. චම්පක, සපුය; අසොක, හෝපලුය; පුන්නාග, දොම්ය; නාග, නාය; පූග, පුවක්ය (යන); අගසම්භවං, වෘක්ෂයන්ගෙන් හටගත්තාවූ (මල්වැසිද); මාලතී, සීනිද්දය (නොහොත්) සම න්ය, වස්සිකීයාදි, දෑසමන්ය යනමේ ආදිවූ; නානාවල්ලීහි සම්භවං, නන්ලියෙන් හටගත්තාවූ (මල්වැසිද).

89. සුගන්ධමධු, සුවඳම් බීමෙන්; මත්තාහි, මත්වූ; ඡප්පද ලීහි, භෘඞ්ගපඞ්ක්තීන් විසින්; කූජිතං, නාදපවත්වනලද; පදුම, පියුම්ය; උප්පල, උපුල්ය; කල්හාර, හෙල්මැලිය; කුමුද හෙලුපුල්ය යන; අදී, මේ ආදිවූ; අම්බුසම්භවං, ජලජවූ (මල් වැසිද).

---

* "ජදෙවකා."

90. පුප්ඵවස්සං පවස්සිංසු තිංසයොජනමජ්ඣගෙ,
පස්සෙනතා තස්ස* තුරඞ්ගො දුක්ඛෙන අගමී තදා.

91. එවං පූජාවිධානෙහි ගන්ත්වානොමං මහානදිං,
සිතසෙකතසඤ්ඡන්නං බහුමීනකුලාකුලං.

92. තීරට්ඨො පස්සි සො ධීරො ගඞ්ගානාරිං රසාවහං,
කරොන්තිං වීචිබාහාහි ඵෙණපුප්ඵොපහාරකං.

93. අස්සෙන තං මහානොමං ලඞ්ඝාපෙත්වා මහාමති,
පරතීරෙ පතිට්ඨාසි විමලෙ වාලුකාතලෙ.

---

90. පුප්ඵවස්සං, (යහමෙ) මල්වැසි ; තිංසයොජනමජ්ඣගෙ, තිස්යොදුන් මාර්ගයෙහි ; පවස්සිංසු, වැස්සේය ; තදා, එකල්හි ; [තස්ස, ඒ මහාසත්වයන්ගේ] ; තුරඞ්ගො, අශ්වතෙම ; තස්ථ, ඒ මල්හි ; පසනෙතා, එරුණේ ; දුක්ඛෙන, දුකින් ; අගමී, ගියේය.

91. එවං, මෙසේ ; පූජාවිධානෙහි, පූජාවිධියෙන් යුක්තව ; සිතසෙකත සඤ්ඡන්නං, සුදුවැල්ලෙන් ගැවසුනාවූ ; බහු, බොහෝවූ ; මීනකුලාකුලං, මත්ස්‍යසමූහයාගෙන් ගැවසීගත්තාවූ ; අනොමං මහානදිං, අනොමා නම් මහාගඞ්ගාතීරයට ; ගන්ත්වා, වැඩ.

92. ධීරො, ධෛර්‍යමත්වූ ; සො, ඒ මහාසත්වතෙම ; තීරට්ඨො, ඉවුරෙහි සිටියේ ; රසාවහං, ෂඩ්රස (හෙවත්) ජලවහනය කරන්නාවූ ; වීචිබාහාහි, තරඟනැමති බාහුවෙන් ; ඵෙණපුප්ඵ, පෙණනැමති මලින් ; උපහාරකං, අසෙනීයමල්පුජ ; කරොන්තිං, කරන්නාවූ ; ගඞ්ගානාරිං, ගඞ්ගානැමති ස්ත්‍රියාව, අපස්සි, දිටි.

93. මහාමති, මහාප්‍රාඥවූ ඒ බොධිසත්වතෙම ; අස්සෙන, අශ්වරාජයාලවා ; තං මහානොමං, ඒ අනෝමා නම් මහගඟ ; ලඞ්ඝාපෙත්වා, පන්වා ; පරතීරෙ, පරතෙරයවූ, විමලෙ, නිර්මලවූ ; වාලුකාතලෙ, වැලිතලාපිට ; පතිට්ඨාසි, පිහිටියේය.

---

* "එනනෙකතා තස්ස."

94. පබ්බජිතුං මයෙසෙව යුත්තං නො මෙ පවට්ටිතුං,
ඉති චින්තිය ඔහාය ධාරිතාභරණානි සො.

95. ඡන්නස්ස පටියාදෙත්වා කන්ථකඤ්ච හයාධිපං,
තිඛිණං ඛග්ගමුග්ගය්හ සමොලිං ඡින්දි කුන්තලං.

96. එවමාවජ්ජයං නාථො සචෙ'හං සුගතො භවෙ,
තිට්ඨතු ගගනෙ ගන්ත්වා ඉති උක්ඛිපි අම්බරං.

97. තතො සක්කො මහග්ඝෙන මණිචඞ්ගොටකෙන තං,
පටිග්ගහෙත්වා සිරසා නෙත්වා දෙවපුරං වරං.

---

94. මයා, මාවිසින්; එසෙව, මෙහිම; පබ්බජිතුං, පැවිදි වන්ට; යුත්තං, යුතුය; මෙ, මට; පවට්ටිතුං, පවත්වන්ට; නො (යුත්තං), යුතුනොවෙයි; ඉති, මෙසේ; සො, ඒ බොධිසත්ව තෙම; චින්තිය, සිතා, ධාරිතාභරණානි, පැලඳි ආභරණයන්; ඔහාය, මුදා.

95. හයාධිපං, තුරඟශ්‍රෙෂ්ඨවූ; කන්ථකඤ්ච, කන්ථකයාද; ඡන්නස්ස, ඡන්න ඇමතියන්ට; පටියාදෙත්වා, භාරකොට; තිඛිණං, තියුණුකරණලද; ඛග්ගං, කඩුව; උග්ගය්හ, ඔසවා ගෙණ; සමොලිං, මෞලිසහිතවූ; කුන්තලං, කෙශකලාපය; ඡින්දි, සිඳී.

96. නාථො, ලොකනාථවූ ඒ මහාසත්වතෙම; අහං, මම; සුගතොභවෙ, බුදුවන්නෙම්නම්; සචෙ, ඉදින්; ගන්ත්වා, ගොස්; ගගනෙ, අහස්කුස; තිට්ඨතු ඉති, සිටීවයි; එවං, මෙසේ; ආවජ්ජයං, ආවර්ජනාකරමින්; අම්බරං, අහසට; උක්ඛිපි, දැමීය.

97. තතො, ඉක්බිති; සක්කො, ශක්‍රදෙවෙන්ද්‍රතෙම; මහග්ඝෙන, මාහැගිවූ; මණිචඞ්ගොටකෙන, මිණිමුවාසුමුගතින්; මහ වරං, උතුම්වූ; තං, ඒ කෙශකලාපය; සිරසා, මස්තකයෙන්; පටිග්ගහෙත්වා, පිළිගෙණ; දෙවපුරං, දිව්‍යපුරයට; නෙත්වා, ගෙණ ගොස්.

98. [illegible]

99. [illegible]

100. [illegible]

101. [illegible]

---

98. [illegible]

99. [illegible]

100. [illegible]

101. [illegible]

102. සම්පුණ්ණමනසඞ්කප්පො පබ්බජ්ජාසිරිමුබ්බහං,
ඡාදෙන්තො කමලෙනෙව මරුං චඞ්කමි නායකො

103. තතො අම්බවනං ගන්ත්වා විඳෙන්තො පීතිජං සු
විතිනාමයි සත්තාහං රම්මෙ පාදපමණ්ඩපෙ.

104. තතො රාජගහං ගන්ත්වා පාරුපිත්වාන චීවරං,
ගහෙත්වා මණිවණ්ණං සො පත්තං කරතලම්බුජ

105. බත්තිංසලක්ඛණූපෙතො අනුබ්‍යඤ්ජනමණ්ඩිතො,
බ්‍රහ්මුජ්ජුගත්තො භගවා පුරසෙට්ඨමුපාගමි.

---

102. නායකො, ලොක නායකවූ මහාබොධිසත්ත්වතෙම
සම්පුණ්ණමනසඞ්කප්පො, පරිපූර්ණ මනස්සඞ්කල්පනා ඇත්
තේ ; පබ්බජ්ජාසිරිං, ප්‍රව්‍රජ්‍යාශ්‍රිය (ශොභාව); උබ්බහං, උසුල
ගේ ; කමලෙන, පද්මයකින් ; මරුං, වැලිතලාව; ඡාදෙන්තො
ඉව ; ප්‍රතිච්ඡාදනය කරන්නාක් මෙන්; චඞ්කමි, සක්මන්කළ
සේක.

103. තතො, ඉක්බිති ; අම්බවනං, (අනුපිය නම්) අඹඋ
නට ; ගන්ත්වා, ගොස් ; පීතිජං, ප්‍රීතියෙන් නිපන් ; සුඛං, සැපය;
විඳෙන්තො, විඳිමින් ; රම්මෙ, සිත්කලුවූ ; පාදපමණ්ඩපෙ, වෘක්‍ෂ
ච්ඡායාමණ්ඩපයෙහි ; සත්තාහං, සත් දිනක් ; විතිනාමයි,
ඉක්මවී.

104. තතො, ඉක්බිත්තෙන් ; සො, ඒ මහාසත්ත්වතෙම ;
චීවරං, සිවුරු; පාරුපිත්වා (සුපිළිසන්ව) පොරවා; මණිවණ්ණං
(ඉඳුනිල්) මිණිපැහැ ඇති ; පත්තං, (ඝන ගෙලමය) පාත්‍රය;
කරතලම්බුජ, හස්තතල නැමති පද්මයෙන් ; ගහෙත්වා, ගෙණ;
රාජගහං, රජගෘහ නගරයට ; ගන්ත්වා, වැඩ.

105. බත්තිංසලක්ඛණ, දෙතිස් මහාපුරුෂලක්ෂණයෙන්;
උපෙතො, යුක්තවූ; අනුබ්‍යඤ්ජන, අසූඅනු ව්‍යඤ්ජනයෙන්; මණ්ඩි
තො, හෙබියාවූ; බ්‍රහ්මුජ්ජුගත්තො, බ්‍රහ්මකාය මෙන් සෘජුවූ
කයක් ඇත්තාවූ; භගවා, භාග්‍යවත් (වූ මහාබොධිසත්ත්ව) තෙම;
පුරසෙට්ඨං, ශ්‍රෙෂ්ඨවූ රජගෘහ නම් නගරයට; උපාගමි, එළඹි
සේක.

106. විසිඛන්තරෙන ගච්ඡන්තං ලොකෙකනයනං ජනා,
දිස්වා එවං විචින්තෙසුං නායං යො සො ජනාධිපො.

107. කාමං පුරවධූනං සොම්ම වත්තසම්බන්ධකාරණෙ,
චන්දො'යමාගතො අජ්ජ සකවෙසෙන නො මති.

108. සුත්වාන තං තදා කෙචි හසන්තා වචනන්තරං,
නායං සසී සසඞ්ඛො සො භානුමෙසොති නො මති.

109. බොධෙතුමාගතො කාමං පොරීනං වදනම්බුජෙ,
සකියෙනෙව රූපෙන විම්හයං පොරිමානුසෙ.

---

106. ජනා, ජනයෝ; විසිඛන්තරෙන, වීථි මධ්‍යයෙන්; ගච්ඡන්තං, වඩනාවූ; ලොකෙකනයනං, ලොවට අසහායනෙත්‍රවූ මහාබොධිසත්වයන්; දිස්වා, දැක; යො, යමෙක්; ජනාධිපො, රජ්ද; සො, හෙතෙම; අයං න, මෙතෙම නොවේයයි; (නොහොත්) අයං ජනාධිපො, මේ ජනශ්‍රෙෂ්ඨතෙම; න යො සො, එසේමෙසේ කෙනෙක් නොවේයයි; එවං, මෙසේ; විචින්තෙසුං, සිතූහු.

107. කාමං, එකාන්තයෙන්; පුරවධූ, පුරස්ත්‍රීන්ගේ; වත්ත සම්බන්ධ කාරණෙ, වක්ත්‍රසම්බන්ධ හෙතුවෙන්; අජ්ජ, අද; චන්දො, චන්ද්‍රතෙම; සකවෙසෙන, ස්වකීයවිලාසයෙන්; ආගතො, ආයේයයි; නො, අපගේ; අයං මති, මේ මතයයි.

108, 109. තදා, එකල්හි; කෙචි (නරා), ඇතම් (මනුෂ්‍යයෝ) තං වචනන්තරං, ඒ වාග්විශෙෂ; සුත්වාන, අසා; හසන්තා, සිනාසෙන්නාහු (මෙසේ කීහු); අයං, මෙතෙම; සසී න, චන්ද්‍රයාද නොවන්නේය; සො, ඒ චන්ද්‍රතෙම; සසඞ්ඛො, සසලෙඛා ඇත්තෙක; එසො භානු, මේ සූර්ය්‍යතෙම; සකියෙනෙව, ස්වකීයවූම; රූපෙන, රූපයෙන් යුක්තව; පොරිමානුසෙ, පුරවාසි මිනිසුන්; විම්හයං, විස්මයප්‍රාප්ත කරමින්; කාමං, එකාන්තයෙන්; පොරීනං, පුරස්ත්‍රීන්ගේ; වදනම්බුජෙ, වක්ත්‍රපද්මයන්; බොධෙතුං, ප්‍රබොධකරන්ට; ආගතො ඉති, ආයේයයි; නො, අපගේ; මති, මතයයි.

110\. කිං භො උම්මත්තකා අත්ථ එවං මා වදථාධුනා,
සතරංසි උණ්හරංසි න සො එසො අවිග්ගහො.

111\. කාමෙනාලසජනතුහි කීළිතුං පුරමාගතො,
සරූපෙන න නො අත්ථි සංසයො ඛලු මානසෙ.

112\. තෙසං තං වචනං සුත්වා හසන්තා කෙචි ජන්තුනො,
තුම්හෙ ඛලු න ජානාථ සබාණො සධනු හි සො.

113\. ඉස්සරො කන්තරූපෙන තුඞ්ගමන්දිරතො පුරං,
කෙලාසො ඉති සම්පත්තො ජහාථ විමතිං ඉධ.

---

110, 111. කිං, කිමෙක්ද ; භො, භවත්නි ; උම්මත්තකා අත්ථ, උමතුවූවහුද ; එවං, මෙසේ ; අධුනා, දැන් ; මාවදථ, නොකියව්; න සතරංසි, සූර්ය්‍යාද නොවේ; සො, එතෙම; උණ්හරංසි, උෂ්ණවූ රශ්මි ඇත්තෙකි ; එසො, මේ ; අවිග්ගහො, අනඞ්ගතෙම ; කාමෙන, කාමයෙන් ; අලසජනතුහි, මැලිවූ ලොකයා සමග; කීළිතුං, රතික්‍රීඩාකරණුපිණිස ; සරූපෙන, ස්වකීය රූපයෙන් ශූන්‍යව ; පුරං, (අප) පුරයට ; අගතො, ආයේය ; නො, අපගේ ; මානසෙ, සිත්හි ; ඛලු, ඒකාන්තයෙන් ; සංසයො, ශංකාවෙක් ; න අත්ථි, නොමැත්තේයි (කීනු).

112\. කෙචි ජන්තුනො, ඇතැම් දනෝ ; තෙසං, ඔවුන්ගේ ; තං වචනං, ඒ වචනය ; සුත්වා, අසා ; හසන්තා, සිනාසෙන්නාහු; තුම්හෙඛලු, තෙපිදු ; නජානාථ, නොදන්නහුය ; හි, ගම්භෙයකින් ; සො, ඒ අනඞ්ගතෙම: සබාණො, ඊසහිතද; සධනු, දුනු සහිතද (එහෙයිනි).

113\. ඉස්සරො, ඊශ්වරතෙම ; කන්තරූපෙන, මනොඥවූ රූපයකින් ; තුඞ්ගමන්දිරතාය, ප්‍රාංශුවූ ගෘහ ඇති බැවින් ; කෙලාසො ඉති, කෛලාසපර්වතය දෝහෝයි ; පුරං, (මේ අප) පුරයට ; සම්පත්තො, පැමිණියේයි ; ඉධ, මෙහි ; විමතිං, විවිධ මතිය ; ජහාථ, අත්හරව් (යි කීනු).

114. තෙසම්පි වචනං සුත්වා හසන්තෙකෙ ජනා තදා,
නායං භවො තිනෙත්තො සො කොසලොචෙසො
ඉධාගතො.

115. විචිනන්තො සිරිං අජ්ජ පුරසෙට්ඨමුපාගතං,
වෙසෙනාඤ්ඤෙන මඤ්ඤාම එත්ථ නො නත්ථි
සංසයො.

116. පහරිත්වා කරං කෙචි සුත්වා තං වචනං නරා,
හසන්තෙවං තදාවොචුං වාසුදෙවො න වෙ අයං.

---

114, 115. තදා, එකල්හි; එකෙ ජනා, ඇතැම් ජනයෝ; තෙසං අපි, ඔවුන්ගේද; වචනං, කීම; සුත්වා, අසා; හසන්තා, සිනා පහලකරන්නෝ; අයං, මේතෙම; භවො න, ඊශ්වරද නොවන්නේය; සො, හෙතෙම; තිනෙත්තො, නෙත් තුණක් ඇත්තෙක; එසො, මේ; කොසලො, ශ්‍රීවිෂ්ණුතෙම; පුරසෙට්ඨං, පුරප්‍රවරයට; උපාගතං, පැමිණියාවූ; සිරිං, ලක්ෂ්මිය; විචිනන්තො, සොයමින්; අඤ්ඤෙන වෙසෙන, අප්‍රසිද්ධ වෙශයකින්; අජ්ජ, අද; ඉධාගතො, මෙහි ආයේයයි; මඤ්ඤාම, හඟිමු; එත්ථ, මෙහිලා; නො, අපට; සංසයො, සැකයක්; නත්ථි, නැති (යි කීහු).

116. තදා, එකල්හි; කෙචි නරා, ඇතැම් මනුෂ්‍යයෝ; තං වචනං, ඒ වචනය; සුත්වා, අසා; කරං පහරිත්වා, හස්තස්ඵොටනය කොට; හසන්තා, සිනාසෙන්නාහු; එවං, මෙසේ; අවොචුං, කීවූ; අයං, මේතෙම; වෙ, ඒකාන්තයෙන්; වාසුදෙවො න, විෂ්ණුද නොවන්නේය.

117. කාමං සරොජ්ජනාතො සො වාමනො කණ්ණ
විගතො,
අයමඤ්ඤතරවණ්ණෙන ආගතො පාකසාසනො.

118. පුරං දෙවපුරමෙතං මඤ්ඤමානො මහාද්‍යුතිං,
පස්සිතුමිති පටිඤ්ඤාතො මා භොන්තො විල
පන්තු වො.

119. සුඛා තෙසං ගිරං කෙචි කෙළිං කත්වාන නෙකධා,
තුම්හෙහ සක්කං න ජානාථ සොහි භො වජිරාවුධො.

120. එසො හි භො මහාබ්‍රහ්මා බ්‍රහ්මලොකා ඉධාගතො,
පමත්තා කිං නු වෙදම්හි බ්‍රහ්මබන්ධු පුරෙ ඉධ.

---

117, 118. සො, ඒ විෂ්ණුතෙම; කාමං, ඒකාන්තයෙන්; සරොජ්ජනාතො, පළමු නාගිය; වාමනො, වාමනාවතාර ඇත්තෙක නොහොත් ලකුණ්ටකය; කණ්ණවිගතො, කැණි වණ්ණ ශරීර ඇත්තේය; අයං, මේ; පාකසාසනො, ශක්‍රදෙ වේන්ද්‍රතෙම; ඒතං පුරං, මේ නුවර; දෙවපුරං ඉති, (ඔහුගේ) දිව්‍යපුරයයි; මඤ්ඤමානො, සිතමින්; මහාද්‍යුතිං, මහත්වූ ශොභාව; පස්සිතුං ඉති, දකින්වයයි; පටිඤ්ඤාතො, ප්‍රතිඥ ඇත්තේ; අඤ්ඤතර වණ්ණෙන, එක්තරා (අප්‍රසිද්ධ) විලාසයකින්; ආගතො, (මෙහි) ආයේය; භොන්තො, පින්වත්නු; වො, ඒකාන්තයෙන්; මා විලපන්තු, ප්‍රලාප නොදොඩත්වා (යි කීහ).

119. කෙචි, සමහරෙක්; තෙසං, ඔවුන්ගේ; ගිරං, (ඒ) කීම; සුඛා, අසා; අනෙකධා, අනෙක ප්‍රකාරයෙන්; කෙළිං කත්වාන, පරිහාස කොට; තුම්හෙ, තෙපි; සක්කං, ශක්‍රයා; න ජානාථ, නොදන්නහුද; භො, භවත්නි; සොහි, ඒ ශක්‍ර තෙමවනායි; වජිරාවුධො, වජ්‍රායුධයක් ඇත්තේයි.

120. භො, පින්වත්නි; එසොහි මහාබ්‍රහ්මා, මේ මහාබ්‍රහ්ම තෙමවනායි; ඉධ පුරෙ, මේ නගරයෙහි; බ්‍රහ්මබන්ධු, බ්‍රාහ්ම බන්ධු (බ්‍රාහ්මණයෝ); වෙදම්හි, වෙද හැදෑරීමෙහි; කිංනු, කිමෙක්දෝ; පමත්තා, ප්‍රමාදවූවාහුදැයි; බ්‍රහ්මලොකා, බඹ ලොවින්; ඉධ ආගතො, මෙහි ආයි (කීහ).

121. අථෙසං වචනං සුත්වා කෙචි පණ්ඩිතජාතිකා,
එතෙ වඤ්ඤදයො කාමං මා මොහං භො
පකාසථ. (3)

122. චතුරානනො මහාබ්‍රහ්මා සොමසොම්මානනො
අයං,
සමන්තපොත්ථකො බ්‍රහ්මා පත්තහත්ථො'ස
මබ්භුතො.

123. කාමං පාරමිතාපුණ්ණො* පසත්ථො පුරිසො අයං,
නිච්චං වන්දථ පූජෙථ ථොමෙථෙතං මහාජ්ජුතිං.

---

121. අථ, ඉක්බිත්තෙන්; කෙචිපණ්ඩිතජාතිකා, ඇතම් පණ්ඩිත ජාතිකයෝ ; එසං වචනං, ඔවුන්ගේ වචනය ; සුත්වා, අසා ; කාමං, ඒකාන්තයෙන් ; එතෙ වඤ්ඤදයො න, තෙල සඳ ආදිහු නොවෙත් ; භො, පින්වත්නි ; මොහං, මොහය; මාපකාසථ, නහමක් ප්‍රකාශකරව්.

122. මහාබ්‍රහ්මා, මහබඹතෙම ; චතුරානනො, චතුර්මුඛ යක් ඇත්තේය ; අයං, මේතෙම ; සොම, චන්ද්‍රයාවැනිවූ ; සොම්මානනො, සෞම්‍ය මුහුනක් ඇත්තේය ; සො මහාබ්‍රහ්මා, ඒ මහාබ්‍රහ්මතෙම ; මන්තපොත්ථකො, වෙදපුස්තකධාරිය ; අයං, මේතෙම ; පත්තහත්ථො, පාත්‍රයක් ගත් අත් ඇත්තේය ; අබ්භුතො, අද්භුතයි.

123. අයං, මේතෙමේ ; කාමං, ඒකාන්තයෙන් ; පාරමිතා පුණ්ණො, පාරමිධර්මයන්ගෙන් පිරුණාවූ (නොහොත්) පිරිණු පෙරුම්දම් ඇති ; පසත්ථො, ප්‍රශස්තවූ ; පුරිසො, පුරුෂයෙකි ; එතං මහාජ්ජුතිං, මේ මහාද්‍යුතිමත් පුරුෂොත්තමයන් ; නිච්චං, අනවරතයෙන් ; වන්දථ, වඳිව් ; පූජෙථ, පුදව් ; ථොමෙථ, පසසව් (ශි කීනු).

---

* "කාමං පාරමි සම්පුණ්ණො."

124. එවං වදන්තා සබ්බෙ තෙ නාගරා පුරිසුත්තමං,
ගන්ධපුප්ඵෙහි පූජෙන්තා නමස්සන්තා තමන්වගුං.

125. නෙත්තාරිත්තෙහි පාජෙන්තා මුනිනො රූප සාගරෙ
ජනතාවො මනොනාවායො පාරං පස්සිංසු නො තදා,

126. තදා ලොකෙකනයනො සපදානෙන වීථියං,
චරං යාපනමත්තං ච ලද්ධාගමම පුරා බහි.

127. පණ්ඩවං ගිරිමාසජ්ජ තස්සච්ඡායාය සො මුනි,
සඞ්ඝාටිං පඤ්ඤපෙත්වාන නිසජ්ජ පුරිසාසභො.

---

124. එවං වදන්තා, මෙසේ කියන්නාවූ; සබ්බෙ තෙ නාගරා, ඒ මුළුනුවරවැස්සෝ ; තං පුරිසුත්තමං, ඒ පුරුෂෝත්තමයන්; ගන්ධපුප්ඵෙහි, ගඳමලින්; පූජෙන්තා, පුදන්නාහු; නමස්සන්තා, නමස්කාරකරන්නාහු ;අන්වගුං, (ඔහු) අනුව (පස්සේ) ගියාහුයි

125. තදා, එකල්හි ; ජනතාවො, ලොකවාසීහු ; මුනිනො, මුනීන්ද්‍රවූ බෝසතාණන්වහන්සේගේ ; රූපසාගරෙ, රූප නැමැති සාගරයෙහි ; මනොනාවායො, සිත් නැමැති නෞකාවන් ; නෙත්තාරිත්තෙහි, නුවන්නැමැති පලුපතින් ; පාජෙන්තා, පදින්නාහු ; පාරං, පරතෙර ; නො පස්සිංසු, නොමදුටුහ.

126. තදා, එකල්හි; ලොකෙකනයනො, ලොවට අසහාය නෙතුවූ බෝසත්තෙම ; සපදානෙන, ගෙපිළිවෙළින් ; වීථියං, වීථියෙහි ; චරං, හැසිරෙන්නේ ; යාපනමත්තං, ඒව යැපෙන පමණක්වූම ආහාරය ; ලද්ධා, ලැබ ; පුරා, පුරයෙන්; බහි අගමම, පිටතට අවුත්.

127. පුරිසාසභො, පුරුෂෝත්තමවූ ; සො මුනි, ඒ මුනීන්ද්‍රවූ බොධිසත්වතෙම ; පණ්ඩවංගිරිං, පාණ්ඩව නම්වූ පර්වතප්‍රාන්තයට ආසජ්ජ, පැමිණ ; තස්ස, ඒ පර්වතයාගේ ; ඡායාය, සෙවණෙහි ; සඞ්ඝාටිං, සඟළ සිවුර ; පඤ්ඤපෙත්වාන, පණවා ; නිසජ්ජ, වැඩහිඳ.

128. අදිට්ඨපුබ්බං දිස්වාන පත්තෙ මිස්සකභොජනං,
සඤ්ජාතපටිකූලො තං නුදිත්වා පච්චවෙක්ඛණෙ.

129. අමතං විය තං භුත්වා වික්ඛාලෙත්වා මුඛං දකා,
පත්තෙ වත්තං චරිත්වාන මුහුත්තං තත්ථ විස්සමි.

130. පවත්තිං තං නිසාමෙත්වා බිම්බිසාරො නරිස්සරො,
සීඝං තමුපගන්ත්වාන කතානුඤ්ඤො නිසීදිය.

131. නිමන්තයිත්වා රජ්ජෙන අනිච්ඡන්තෙ යතිස්සරෙ,
අනුග්ගහාය මෙ යුත්තං බුද්ධභූතෙනිධාගමං.

---

128. පත්තෙ, පාත්‍රයෙහි ; අදිට්ඨ පුබ්බං, නුදුටුවිරූ ; මිස්සකභොජනං, මිශ්‍රකාහාරය; දිස්වා, දැක ; සඤ්ජාතපටිකූලො, හටගත් පිළිකුල් ඇත්තේ ; පච්චවෙක්ඛණෙ, ප්‍රත්‍යවෙක්ෂා හෙතුවෙන් ; තං, ඒ ප්‍රාතිකූල්‍යය ; නුදිත්වා, දුරැකොට.

129. තං, ඒ ඇවිලිලි ආහාරය ; අමතං විය, අමෘතයක් මෙන් ; භුත්වා, වළඳා ; මුඛං, මුඛය ; දකා, පැනින් ; වික්ඛාලෙත්වා, පවිත්‍රකොට නොහොත් සෝදා ; පත්තෙ, පාත්‍රයෙහි ; වත්තං චරිත්වාන, වත්කොට ; මුහුත්තං, මුහුර්තකාලයක් ; තත්ථ, එහි ; විස්සමි, විඩා ගලුසේක.

130. බිම්බිසාරො නරිස්සරො, බිම්සර රජතෙම; තං පවත්තිං, ඒ ප්‍රවෘත්තිය ; නිසාමෙත්වා, අසා ; සීඝං, සුනුව ; තං උපගන්ත්වාන, උන්වහන්සේවෙත එළඹ ; කතානුඤ්ඤො, කරණලද අනුඥ ඇත්තේ ; නිසීදිය, හිඳ.

131. රජ්ජෙන, රාජ්‍යයෙන් ; නිමන්තයිත්වා, පවරා ; යතිස්සරෙ, යතීශ්වරවූ බෝසත්හු ; අනිච්ඡන්තෙ, නොකැමැත් කල්හි ; බුද්ධභූතෙන, බුදුවූ තුඹවහන්සේ විසින් ; මෙ, මට ; අනුග්ගහාය, අනුග්‍රහපිණිස ; ඉධාගමං, මෙහි ඒම ; යුත්තං, යුතු වන්නේයි.

132. එවං නිමන්තිතො තෙනාධිවාසෙත්වා මහාමති,
අගමාසුරුවෙලාය'තුලොරුපරක්කමො.

133. පධානං පදහිත්වාන ඡබ්බස්සමතිදුක්කරං,
පකාසෙත්වාන ලොකස්ස මොක්ඛං නත්ථීති තෙන සො.

134. තතොප්පභුති වත්තෙන්තො මජ්ඣිමප්පටිපත්තියං,
කායස්සානුග්ගහං කත්වා තතො සම්පුණ්ණින්ද්‍රියො.

135. මූලෙ'ජපාලනිග්‍රොධපාදපස්ස මහාමුනි,
නිසීදි නිජසොභාහි ඔභාසෙන්තො දිසොදිසං.

---

132. තෙන, ඒ රජුහු විසින් ; එවං, මෙසේ ; නිමන්තිතො, ආරාධනා කරණලද්දවූ ; අතුල, අසදෘශවූ ; උරුපරක්කමො, මහත් පරාක්‍රමඇති; මහාමති, මහාප්‍රාඥවූ බෝසත්තෙම; උරුවෙලායං, උරුවෙල් දනව්වට ; අගමාසි, වැඩියේක.

133. සො, ඒ මහබෝසත්තෙම ; ඡබ්බස්සං, සාවුරුද්දක් මුළුල්ලෙහි ; අතිදුක්කරං, අතිශයින් දුෂ්කරවූ ; පධානං පදහිත්වාන, වීර්‍ය්‍යකොට නොහොත් වීර්‍ය්‍ය වඩා ; තෙන, ඒ වීර්‍ය්‍ය කරණයෙන් ; මොක්ඛං, මෝක්‍ෂයක් ; නත්ථි ඉති, නැතැයි; ලොකස්ස, ලොවට ; පකාසෙත්වාන, ප්‍රකාශකොට.

134. තතොප්පභුති, එතැන්පටන් ; මජ්ඣිමප්පටිපත්තියං, මධ්‍යම ප්‍රතිපදාවෙහි ; වත්තෙන්තො, පවත්නේ ; කායස්ස, ශරීරයට ; අනුග්ගහං කත්වා, අනුග්‍රහ කොට ; තතො, එයින්; සම්පුණ්ණින්ද්‍රියො, පිණගිය ඉඳුරන් ඇත්තේ.

135. මහාමුනි, මහාතපස්වීවූ බොධිසත්වතෙම ; අජපාලිනිග්‍රොධපාදපස්ස, අජපාල න්‍යග්‍රොධවෘක්‍ෂයාගේ ; මූලෙ, මුල් සමීපයෙහි ; නිජසොභාහි, ස්වකීය ශොභාවෙන් ; දිසොදිසං, දිශානුදිශාවන් ; ඔභාසෙන්තො, බබුළුවමින් ; නිසීදි, වැඩ උන්සේක.

136. තදා සෙනානිනිගමෙ සුජාතා ඛීරදූසිකා,*
සම්පුණ්ණමනසඞ්කප්පා යාචිත්වා වටදෙවතං.

137. ධීරං දෙවොති මඤ්ඤන්ති තුට්ඨහට්ඨා පමොදිතා,
හෙමපාතිං සපායාසං දත්වාන ඉදමබ්‍රවි.

138. යථා මය්හං මහාදෙව ඉද්ධා පත්ථිත පත්ථනා,
තථෙව තව සඞ්කප්පො ඛිප්පමෙව සමිජ්ඣතු.

139. ඉති වත්වාන වන්දිත්වා කත්වා ච නං පදක්ඛිණං,
පක්කාමන්තාය සුජාතාය ධීරො පාතිං සමාදිය.

---

136. තදා, එකල්හි ; සෙනානිනිගමෙ, සෙනානි නම් නියම් ගමෙහි ; සුජාතා ඛීරදූසිකා, සුජාතා නම් ක්ෂීරදූසිකාතොමෝ ; සම්පුණ්ණ, පිරුණාවූ ; මනසඞ්කප්පා, චිත්ත සඞ්කල්පනා ඇත්තී ; වටදෙවතං, නුගරුක්වැසි දෙවියාට ; යාචිත්වා, යැද.

137. ධීරං, ප්‍රාඥවූ ඒ බෝසතානන් ; දෙවොඉති, (වෘක්ෂවාසී) දෙවියෙකැයි ; මඤ්ඤන්තී, හඟනී ; තුට්ඨහට්ඨා, තුටුපහටුවූවා ; පමොදිතා, ප්‍රමෝදයට පැමිනියා ; සපායාසං, කිරිපිඩු සහිතවූ ; හෙමපාතිං, රන්තැටිය ; දත්වාන, දී ; ඉදං, මේ මතු කියන කාරණය ; අබ්‍රැවි, කී.

138. මහාදෙව, මහාදෙවයන්වහන්ස ; මය්හං, මාගේ ; පත්ථිත පත්ථනා, පතනලද ප්‍රාර්ථනාව ; යථා ඉද්ධා, යම්සේ සමෘද්ධවූවාද ; තථා එව, එපරිද්දෙන්ම ; තව, නුඹවහන්සේගේ ; සඞ්කප්පො, සඞ්කල්පනාව ; ඛිප්පං එව, වහාම ; සමිජ්ඣතු, සමෘද්ධ වේවා.

139. ඉති වත්වාන, මෙසේ කියා ; නං, උන්වහන්සේ ; වන්දිත්වා, වැඳ ; පදක්ඛිණං ච කත්වා, පැදකුණුද කොට ; සුජාතා, සුජාතාවන් ; පක්කාමන්තාය, බැහැර ගිය කල්හි ; ධීරො, ප්‍රාඥවූ මහබෝසත්තෙම ; පාතිං, තලිය ; සමාදිය, රැගෙණ.

---

* "සුජාතා කිරදූරිකා."

140. උපගන්ත්වානාභිරම්මං නදිං සො නීලවාහිනිං,
සුප්පතිට්ඨිතනාමම්හි නදීතිත්ථෙ නිසීදිය.

141. භුඤ්ජිත්වා ඌනපණ්ණාසපිණ්ඩං කත්වාන භොජනං,
විසජ්ජෙත්වා තතො පාතිං පටිසොතං නරාසභො.

142. තතො සාලවනුය්‍යානෙ විස්සමෙන්තො දිවාදිනෙ,
දිස්වාන සුපිනෙ පඤ්ච අත්‍ථං තෙසං විචින්තිය.

143. අබොධිමූලතො (4) මග්ගෙ දෙවෙහි සමලඞ්කතෙ,
මණිතොරණපාළීහි* පුණ්ණකුම්භධජාදිහි.

---

140. සො, ඒ මහබෝසත්තෙම ; අභිරම්මං, ඉතා රම්‍යවූ ; නීලවාහිනිං, නිල්දලා නම්වූ ; නදිං, ගොය කරා ; උපගන්ත්වාන, එළඹ ; සුප්පතිට්ඨිත නාමම්හි, සුප්‍රතිෂ්ඨිත යන නාමයක් ඇත්තාවූ ; නදීතිත්ථෙ, ගංතොට ; නිසීදිය, වැඩහිඳ.

141. නරාසභො, නරශ්‍රෙෂ්ඨවූ මහබෝසත්තෙම ; ඌන පණ්ණාස පිණ්ඩං කත්වාන, එකුන්පණස් පිඩක් කොට ; භොජනං, බොජුන ; භුඤ්ජිත්වා, වළඳා ; තතො, ඉක්බිති ; පාතිං, රන්තලිය ; පටිසොතං, උඩුගං බලා ; විසජ්ජෙත්වා, සවා.

142. තතො, ඉක්බිති ; දිවාදිනෙ, දවල්දවසැ ; සාලවනුය්‍යානෙ, ශාලවනොද්‍යානයෙහි ; විස්සමෙන්තො, පරිශ්‍රමය දුරුකරන්නේ ; පඤ්චසුපිනෙ, පඤ්ච ස්වප්නයන් ; දිස්වාන, දැක ; තෙසං, ඒ ස්වප්නයන්ගේ ; අත්‍ථං, අර්ථය ; විචින්තිය, සිතා.

143. අබොධිමූලතො, බොධිවෘක්ෂමූලය දක්වා ; මණිතොරණපාළීහි, මිණිතොරන්පෙළින්ද ; පුණ්ණකුම්භා, පුන්කලස්නා ; ධජාදිහි, ධ්වජාදියෙන්ද ; දෙවෙහි, දෙවියන් විසින් ; සමලඞ්කතෙ, මොනවට සරසනලද්දාවූ ; මග්ගෙ, මාර්ගයෙහි.

---

* "මණිතොරණාදි පාළීහි."

144. සායණ්හසමයෙ නාථො ගච්ඡන්තො බොධි සන්තිකං,
දිස්වාන සොත්ථියං නාම ථුසමානං දිජුත්තමං.

145. තෙන දින්නට්ඨමුට්ඨිනතු ගහෙත්වා නීලසද්දලං,
බොධිමූලමුපාගම්ම කත්වාන තං පදක්ඛිණං.

146. අකාසි තිණසන්ථාරං පාචීනාභිමුඛං තදා,
තතො මහිං * ද්විධා කත්වා සමුට්ඨාසි මහාසනං.

147. උච්චං චුද්දසහත්ථෙන නානා විතත විචිත්තිතං,
අධිට්ඨහිත්ථ තත්‍රෙසො ඉච්චෙවං දළ්හමානසො.

144. නාථො, ලොකනාථවූ ඒ මහබෝසත්තෙම; සායණ්හසමයෙ, සවස්වේලෙහි; බොධිසන්තිකං, බොධිද්‍රුම සමීපයට; ගච්ඡන්තො, වඩනේ; ථුසමානං, සතුති ගායනාකරන්නාවූ; සොත්ථියං නාම, සොත්ථිය නම්වූ; දිජුත්තමං, බමුණුතුමන්; දිස්වාන, දැක.

145. තු, වැලි; තෙන, ඒ සොත්ථිය නම් බමුණන් විසින්; දින්න, දෙනලද; අට්ඨමුට්ඨිං, අටමිටවූ; නීලසද්දලං, නිල් කුසතණ; ගහෙත්වා, ගෙණ; බොධිමූලං, බොධිවෘක්ෂ සමීපයට; උපාගම්ම, පැමිණ; තං, ඒ බෝරුක; පදක්ඛිණං කත්වාන, පැදකුණු කොට.

146, 147. තදා, එකල්හි; පාචීනාභිමුඛං, පැදුම්දෙසට අභිමුඛ කොට; තිණසන්ථාරං, තණ ඇතිරියක්; අකාසි, කෙළේය; තතො, ඉක්බිති; මහිං, පෘථිවිය; ද්විධා කත්වා, දෙපළු කොට; චුද්දසහත්ථෙන, තුදුස් රියනකින්; උච්චං, උස්වූ; නානා විතත, අනේක ප්‍රකාර සිතියමින්; විචිත්තිතං, විසිතුරු කරණලද්දවූ; මහාසනං, මහත්වූ ආසනයක්; සමුට්ඨාසි, පැණනැගේය; තත්‍රෙසො, ඒ වජ්‍රාසනස්ථවූසේක්; ඉති එවං, මේ වක්ෂ්‍යමාණ කාරයෙන්; අධිට්ඨහිත්ථ, ඉටී.

* “මහී.”

140. උපගන්ත්වානාතිරම්මං නදිං සො නීලවාහිනිං,
සුප්පතිට්ඨිතනාමම්හි නදීතිත්ථෙ නිසීදිය.

141. භුඤ්ජිත්වා ඌනපණ්ණාසපිණ්ඩං කත්වාන භොජනං,
විස්සජ්ජෙත්වා තතො පාතිං පටිසොතං නරාසභො.

142. තතො සාලවනුය්‍යානෙ විස්සමෙන්තො දිවාදිනෙ,
දිස්වාන සුපිනෙ පඤ්ච අත්ථං තෙසං විචින්තිය.

143. ආබොධිමූලතො (4) මග්ගෙ දෙවෙහි සමලඞ්කතෙ,
මණිතොරණපාලිහි* පුණ්ණකුම්භධජාදිහි.

---

140. සො, ඒ මහබෝසත්තෙම; අතිරම්මං, ඉතා රම්‍යවූ; නීලවාහිනිං, නිල්දලා නම්වූ; නදිං, ගඟ කරා; උපගන්ත්වාන, එළඹ; සුප්පතිට්ඨිත නාමම්හි, සුප්‍රතිෂ්ඨිත යන නාමයක් ඇත්තාවූ; නදීතිත්ථෙ, ගංතොට; නිසීදිය, වැඩහිඳ.

141. නරාසභො, නරශ්‍රෙෂ්ඨවූ මහබෝසත්තෙම; ඌනපණ්ණාස පිඩං කත්වාන, එකුන්පණස් පිඩක් කොට; භොජනං, බොජුන; භුඤ්ජිත්වා, වළඳා; තතො, ඉක්බිති; පාතිං, රන්තලිය; පටිසොතං, උඩුගං බලා; විස්සජ්ජෙත්වා, යවා.

142. තතො, ඉක්බිති; දිවාදිනෙ, දවල්දවසැ; සාලවනුය්‍යානෙ, සාලවනොද්‍යානයෙහි; විස්සමෙන්තො, පරිශ්‍රම දුරුකරන්නේ; පඤ්චසුපිනෙ, පස් ස්වප්නයන්; දිස්වාන, දැක; තෙසං, ඒ ස්වප්නයන්ගේ; අත්ථං, අර්ථය; විචින්තිය, සිතා.

143. ආබොධිමූලතො, බොධිවෘක්ෂමූලය දක්වා; මණිතොරණපාලිහි, මිණිතොරන්පෙළින්ද; පුණ්ණකුම්භ, පුන්කලස්හා; ධජාදිහි, ධවජාදියෙන්ද; දෙවෙහි, දෙවියන් විසින්; සමලඞ්කතෙ, මොනවට සරසනලද්දාවූ; මග්ගෙ, මාර්ගයෙහි.

---

* "මණිතොරණාදි පාලිහි."

144. සායණ්හසමයෙ නාථො ගච්ඡන්තො බොධිසන්තිකං,
දිස්වාන සොත්ථියං නාම ථූසමානං දිජුත්තමං.

145. තෙන දින්නට්ඨ මුට්ඨිං තු ගහෙත්වා නීලසද්දලං,
බොධිමූලමුපාගම්ම කත්වාන තං පදක්ඛිණං.

146. අකාසි තිණසන්ථාරං පාචීනාභිමුඛං තදා,
තතො මහිං * විධා කත්වා සමුට්ඨාසි මහාසනං.

147. උච්චං මුද්ධසහස්සෙන නානා චිත්ත විචිත්තිතං,
අධිට්ඨිස්ස තතුරඤ්ඤො ඉච්චෙවං දළ්හමානසො.

---

144. නාථො, ලොකස්වාමිවූ ඒ මහබෝසත්තෙම ; සායණ්හසමයෙ, සවස්වේලෙහි; බොධිසන්තිකං, බොධිද්‍රැම සමීපයට ; ගච්ඡන්තො, වඩනේ ; ථූසමානං, සතුති ගායනාකරන්නාවූ ; සොත්ථියං නාම, සොත්ථිය නම්වූ ; දිජුත්තමං, බමුණු අමින් ; දිස්වාන, දැක.

145. තු, වැලි ; තෙන, ඒ සොත්ථිය නම් බමුණන් විසින් ; දින්න, දෙනලද ; අට්ඨමුට්ඨිං, අටමිටිවූ ; නීලසද්දලං, නිල් තුස තණ ; ගහෙත්වා, ගෙණ ; බොධිමූලං, බොධිවෘක්ෂ සමීපයට ; උපාගම්ම, පැමිණ ; තං, ඒ බෝරුක ; පදක්ඛිණං කත්වාන, පැදකුණු කොට.

146, 147. තදා, එකල්හි ; පාචීනාභිමුඛං, පැදුම්දෙසට අභිමුඛ කොට ; තිණසන්ථාරං, තණ ඇතිරියක් ; අකාසි, කෙළේය ; තතො, ඉක්බිති ; මහිං, පෘථිවිය ; විධා කත්වා, දෙපලු කොට ; මුද්ධසහස්සෙන, තුදුස් රියනක්හ් ; උච්චං, උස්වූ ; නානා චිත්ත, අනෙක ප්‍රකාර සිතියම්හ් ; විචිත්තිතං, විසිතුරු කරණලද්දුවූ ; මහාසනං, මහත්වූ අසනයක් ; සමුට්ඨාසි, පැණනැඟේය ; තතුරඤ්ඤො, ඒ වජ්‍රාසනස්ථවූසේක් ; ඉති එවං, මේ වක්ෂ්‍යමාණ ප්‍රකාරයෙන් ; අධිෂ්ඨිතව, ඉටි.

---

* "මණී."

148. කාමං තචො නහාරූ ච අට්ඨි ච අවසිස්සතු,
උපසුස්සතු මෙ ගත්තා සබ්බන්තං මංසලොහිතං.

149. න උට්ඨහාමබුජ්ඣිත්වා න ජහෙ විරියං මම,
අධිට්ඨහිත්වා එවං සො නිසීදි වජිරාසනෙ.

150. අනික්කමං ඨපෙත්වාන චරණං චරණූපරි,
කමලං කමලෙනෙව මණ්ඩිතං විධාය සො.

151. බාලාසොකදලාසත්තා පරංවාසොකපල්ලවං.
නිධාය නයනානන්ද පාණිං පාණිතලෙ ජිනො.

---

148, 149. මෙ, මාගේ ; ගත්තා, ශරීරයෙහි ; තචො, සම්ද ; නහාරූ ච, නහර ද ; අට්ඨි ච, ඇට ද ; අවසිස්සතු, අවශිෂ්ට වේවා ; තං සබ්බං, ඒ සියලු ; මංස ලොහිතං, මස් ලේ ; උපසුස්සතු, වියලී යේවා ; කාමං, ඒකාන්තයෙන් ; අබුජ්ඣිත්වා, බුදු නොවී නොහොත් සත්‍යාවබෝධ නොකොට ; න උට්ඨහාමි, නොනැගී සිටිමි ; මම, මාගේ ; විරියං, වීර්‍ය්‍යය ; න ජහෙ, නොහරිමි ; සො, ඒ මහාබෝධිසත්වතෙම ; එවං, මෙසේ ; අධිට්ඨහිත්වා, අධිෂ්ඨාන කොට; වජිරාසනෙ, විදුරසුන් මතුයෙහි; නිසීදි, වැඩහුන්සේක.

150. සො, ඒ මහාබෝධිසත්වතෙම ; කමලං, පද්මයක් ; කමලෙන ඉව, පද්මයකින් මෙන් ; චරණං, ශ්‍රීපාදය ; අනික්කමං, නොඉක්මවමින් ; චරණූපරි, ශ්‍රීපාදය පිට ; ඨපෙත්වාන, තබාගෙණ ; මණ්ඩනං, මිණිබැන්ද; විධාය, (එකිනෙක පිට) පිහිටුවාගෙණ.

151. ජිනො, ඒ මහාබෝධිසත්වයන්වහන්සේ ; බාලාසොකදල, ලා හෝපලුපතෙන්හි ; ආසත්ත, වැලඳුනාවූ ; පරං අසොකපල්ලවං ඉව, අනික් හොපලුපලුපතක් මෙන්; පාණිතලෙ, අත්ලෙහි ; නයනානන්ද, නෙත්‍රොත්සවවූ ; පාණිං, ශ්‍රීහස්තය; නිධාය, පිහිටුවාගෙණ.